# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සමීක්ෂණය

## 2024 - 2025



NATIONAL LIBRARY OF SRI LANKA

NLSL

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07



# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සමීක්ෂණය

# 2024 - 2025

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2025**

**ISBN 978-624-5747-19-1**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සමීක්ෂණය 2024-2025. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2025.
පි. 65 : රූපසටහන් ; සෙමී. 29.

ISBN 978-624-5747-19-1

i.027.40285072 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය

1. පුස්තකාල-ස්වයංක්‍රීයකරණය-ශ්‍රී ලංකාව
2. මහජන පුස්තකාල-ස්වයංක්‍රීයකරණය-ශ්‍රී ලංකාව
3. පුස්තකාල සමීක්ෂණ

**සම්පාදන උපදේශකත්වය**

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ - සභාපති
ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්

**සම්පාදක අධීක්ෂණය හා සංස්කරණය**

පද්මා බණ්ඩාරනායක - අධ්‍යක්ෂ
නිම්මි දේශප්‍රිය - සහකාර අධ්‍යක්ෂ

**දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා වාර්තාව සම්පාදනය**

නිම්මි දේශප්‍රිය - සහකාර අධ්‍යක්ෂ
උදිත ගුණසේකර - පර්යේෂණ නිලධාරි

**පරිගණක අක්ෂර සංයෝජනය**

සසිකා රණසිංහ - කළමනාකරණ සහකාර

**ප්‍රකාශනය**

පුස්තකාල පර්යේෂණ අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක. 14, නිදහස් මාවත
කොළඹ 07.
දුරකථන : 011 2968847
ෆැක්ස් : 011 2685201
විද්‍යුත් තැපැල : research@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සමීක්ෂණය

# 2024 - 2025

පුස්තකාල පර්යේෂණ අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පෙරවදන

මිනිසාගේ සිතුවිලි, අදහස් සහ ඔහුගේ නිර්මාණාත්මක පරිකල්පනය පිළිබඳ වාර්තා සියල්ලම නිදහසේ ලබා ගත හැකි විවෘත ප්‍රවේශ ආයතනයක් ලෙස ක්‍රියාකරන මහජන පුස්තකාල, සමාජ අභිවෘද්ධිය උදෙසා සේවාවන් රැසක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සඳහා නායකත්වය සපයන නියමු ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පුස්තකාල පර්යේෂණ අංශය මඟින් සිදු කර ඇති මෙම සමීක්ෂණය මඟින් ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල (Automated Public Libraries) සහ ඒ මඟින් ජනතාවට ලබා ගත හැකි නව්‍ය සේවාවන් මෙන්ම මෙම පුස්තකාලවල වර්තමාන ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනයට ලක් කර ඇත. ශ්‍රී ලංකාවේ සියලු පළාත් පාලන ආයතන නියෝජනය කරමින් ව්‍යාප්තව පවත්නා මහජන පුස්තකාල ආශ්‍රිතව සිදු කරන ලද මෙම සමීක්ෂණය ඇසුරින් සකස්කර ඇති "ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ සමීක්ෂණය 2024-2025" වාර්තාව ඉතා අගය කොට සලකන අතර මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරු මෙන්ම නිගමන සහ යෝජනා පුස්තකාල ක්ෂේත්‍රයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනයේදී මෙන්ම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ට, පර්යේෂකයින්ට සහ අදාළ සියලු පාර්ශවයන්ට ඉතා වැදගත් වේ.

මෙම සමීක්ෂණය සඳහා සියලුම පළාත්වල මහජන පුස්තකාල මඟින් දත්ත රැස්කිරීමට සහයෝගය ලබා දුන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවල පළාත් පාලන කොමසාරිස්වරුන්ට, පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට, ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට සහ දත්ත ලබා දුන් පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු සහ කාර්යමණ්ඩලයට හෘදයාංගම ස්තුතිය පිරිනමමි. මෙම සමීක්ෂණය සැලසුම් කිරීම, ප්‍රශ්නාවලි යොමු කිරීම සහ දත්ත ලබා ගැනීම, අදාළ දත්ත පදනම නිර්මාණය, දත්ත විශ්ලේෂණය කිරීම හා වාර්තාව සම්පාදනය කළ පුස්තකාල පර්යේෂණ අංශයේ අංශ ප්‍රධාන නිම්මි දේශප්‍රිය මහත්මිය සහ පර්යේෂණ නිලධාරී උදිත ගුණසේකර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මෙම සමීක්ෂණය සාර්ථකව සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් සිදු කළ පුස්තකාල පර්යේෂණ අංශයේ උපදේශක කමිටුවට, අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් මහතාට, අධ්‍යක්ෂ පද්මා බණ්ඩාරනායක මහත්මියට සහ නන් අයුරින් සහාය වූ සියලු දෙනාට ස්තුතිය පුද කර සිටිමි.

පුස්තකාල පර්යේෂණ අංශය මඟින් කාලීනව සිදු කරන මෙවැනි සමීක්ෂණ සහ පර්යේෂණාත්මක අධ්‍යයනයන් මඟින් ශ්‍රී ලංකාවේ විවිධ පුස්තකාලවල වත්මන් තත්ත්වය පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ විමසා බැලීම ඉතා අගයකොට සලකමි. මෙවැනි සමීක්ෂණ මඟින් අනාවරණය වන තොරතුරු පාදක කරගනිමින් සමාජයීය ආයතනයක් වන මහජන පුස්තකාල නව තාක්ෂණික ක්‍රමෝපායයන් හා පහසුකම්වලින් සපිරි අංගසම්පූර්ණ ආයතන ලෙස ජනතාවට තිළිණ කිරීම උදෙසා අදාළ පාර්ශවයන් ද ඒකරාශී කරගනිමින් නිරන්තරව කටයුතු කිරීම හා අදාළ සැලසුම් ක්‍රියාවට නැංවීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අභිප්‍රාය වේ.

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# හැඳින්වීම

නව දැනුම සොයාගැනීම, අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ගැනීම සහ සමාජයේ තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කිරීමේ කේන්ද්‍රස්ථාන ලෙස මහජන පුස්තකාල අතීතයේ සිට වැදගත් කාර්යභාරයක් ඉටු කර තිබේ. වත්මන් තොරතුරු යුගයේ දී, සාම්ප්‍රදායික පුස්තකාල සේවා තවදුරටත් ප්‍රමාණවත් නොවන අතර, ඩිජිටල් පරිවර්තනය හා ස්වයංක්‍රියකරණය මඟින් මෙම ආයතනවල කාර්යක්ෂමතාව, ප්‍රවේශ්‍යතාව සහ සේවා ගුණාත්මකභාවය විප්ලවීය ලෙස වර්ධනය කළ හැකිය. ග්‍රන්ථ සූචිකරණය, පාඨක කළමනාකරණය, ග්‍රන්ථ සංසරණය සහ තොරතුරු ගවේෂණය වැනි මූලික ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීමෙන්, පුස්තකාල කාර්ය මණ්ඩලයට වඩාත් අර්ථවත් සහ නව්‍යමය සේවා සඳහා කාලය වෙන් කිරීමට හැකියාව ලැබේ.

මහජන පුස්තකාල පද්ධතිය රටේ සමාජ ආර්ථික සහ අධ්‍යාපනික සංවර්ධනයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ක්‍රියා කරන අතර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි (NLDSB) මඟ පෙන්වීම යටතේ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වන මෙම පුස්තකාල, පුළුල් පාඨක ප්‍රජාවකට සේවා සපයයි. පසුගිය දශක කිහිපය තුළ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (NLDSB), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වැනි ආයතන සමඟ ඒකාබද්ධව දියත් කළ ව්‍යාපෘති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ විවිධ පළාත් පාලන ආයතන විසින් මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සහ කාර්යයන් රැසක් ආරම්භ කර තිබේ.

කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය, බලපෑම සහ අඛණ්ඩතාවය පිළිබඳව පුළුල් සහ ක්‍රමවත් ලෙස සමාලෝචනය කර ඇති සමීක්ෂණ හෝ අධ්‍යයන සිදුවී නොමැත. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ වර්තමාන තත්ත්වය, ව්‍යාප්තිය, භාවිත වන තාක්ෂණික ප්‍රවණතා, මුහුණ දෙන අභියෝග සහ අනාගත අවශ්‍යතා පිළිබඳව ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ ඇති පර්යේෂණාත්මක සාක්ෂි සපයා දීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදු කරන ලදි.

මෙම වාර්තාව, අදාළ සියලුම පාර්ශවවලට, ප්‍රතිපත්ති සම්පාදකයින්, පුස්තකාල වෘත්තිකයින්, පර්යේෂකයින් සහ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීමට කටයුතු කරන අතර, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම සහ ඩිජිටල් යුගයට ප්‍රවේශකරවීම සඳහා අත්‍යාවශ්‍ය තීරණ ගැනීමේදී මෙය මඟපෙන්වීමක් ලබා දෙනු ඇතැයි විශ්වාස කරමි.

මෙම සමීක්ෂණය සාර්ථකව ඉටු කිරීමට කටයුතු කළ අධ්‍යක්ෂ, පද්මා බණ්ඩාරනායක මහත්මියට සහ මෙම සමීක්ෂණය සිදු කිරීම, දත්ත විශ්ලේෂණය සහ වාර්තාව සම්පාදනය කළ පුස්තකාල පර්යේෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ නිම්මි දේශප්‍රිය මහත්මියට සහ පර්යේෂණ නිලධාරී උදිත ගුණසේකර මහතාට සහ එම අංශයේ කාර්යය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමි.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පටුන


පෙරවදන v

හැඳින්වීම vi

**පළමු පරිච්ඡේදය**

01. හැඳින්වීම 1-9

1.1 ස්වයංක්‍රියකරණය 1

1.2 ස්වයංක්‍රියකරණයේ විකාශය සහ පුස්තකාල ස්වයංක්‍රියකරණය 2

1.3 පුස්තකාල ස්වයංක්‍රියකරණය 2

1.4 ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රියකරණය 4

1.5 පර්යේෂණ අරමුණු 6

1.6 සමීක්ෂණය මඟින් අවධානය යොමු කරනු ලබන ක්ෂේත්‍ර 7

1.7 අධ්‍යයනයේ වැදගත්කම සහ පර්යේෂණ ගැටලුව 7

1.8 පර්යේෂණ ක්‍රමවේදය 8-9

1.8.1. නියැදිය 8

1.8.2. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය 9

**දෙවන පරිච්ඡේදය**

02. දත්ත විශ්ලේෂණය 10-28

2.1. පුස්තකාල පිළිබඳ මූලික තොරතුරු 10

2.1.1. පළාත් පාලන ආයතන අනුව පුස්තකාල ව්‍යාප්තිය 10

2.2 ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රියකරණය කිරීම 11

2.2.1. පළාත් පාලන ආයතනවලට අයත් ස්වයංක්‍රියකරණය කරන ලද මහජන පුස්තකාලවල ව්‍යාප්තිය 12

2.2.2. ස්වයංක්‍රියකරණය කරන ලද මහජන පුස්තකාල සතු පොත් එකතු 13

2.2.3. බැහැර දෙන අංශයට අයත් පොත් එකතුව 16

2.2.4. වාර සඟරා එකතුව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව 17

2.3. පුස්තකාලය භාවිත කරන ක්‍රියාකාරී සාමාජිකයන් සංඛ්‍යාව 18

2.4. මහජන පුස්තකාල ස්වයංක්‍රියකරණය/පරිගණකගත කිරීම් සිදු කර ඇති කාලපරිච්ඡේදය 19

2.5. ස්වයංක්‍රියකරණය/පරිගණකගත කිරීමේ ක්‍රියාවලියේදී යොදාගෙන තිබෙන පරිගණක මෘදුකාංග/පරිගණක වැඩසටහන් 20

2.6. ස්වයංක්‍රීකරණය කිරීමේ කටයුතු සිදු කරන ලද විවිධ ව්‍යාපෘති/වැඩසටහන් 22-28

**තෙවන පරිච්ඡේදය**


03. ස්වයංක්‍රියකරණ ව්‍යාපෘති යටතේ මහජන පුස්තකාල සංවර්ධනය කිරීම සහ වර්තමාන තත්වය 29-32

3.1. ස්වයංක්‍රියකරණ ව්‍යාපෘති යටතේ පුස්තකාල වෙත ලබාදී ඇති භෞතික සම්පත් 29

3.1.1. ලැප්ටොප්, ඩෙස්ක්ටොප් හා ටැබ් පරිගණක ලබා දීම 29

3.1.2. සර්වර් (Server) පහසුකම් ලබාදීම 30

3.1.3. බාකෝඩ් ප්‍රින්ටර්ස් (Barcode Printers), බාකෝඩ් රීඩර්ස් (Barcode Readers) සහ ඡායා පිටපත් යන්ත්‍ර (Photocopy Machines) ලබාදීම 32


**සිව්වන පරිච්ඡේදය**


04. ස්වයංක්‍රියකරණයට අදාළ මූලික කාර්යයන් සිදු කිරීම හා වැඩි දියුණු කරන ලද පහසුකම් 33-42

4.1. දත්ත පදනම් සංවිධානය හා ඇතුළත් කර ඇති මූලාශ්‍ර 33

4.2. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා ප්‍රමාණය (Total Cataloguing Records) 34

4.3. සාමාජික තොරතුරු සංඛ්‍යාව (Patron Records) 35

4.4. කොහා (KOHA) මෘදුකාංගයෙහි භාවිත කරනු ලබන මොඩියුල (Modules) වර්ග 36

4.5. ස්වයංක්‍රියකරණය හා ඒ සම්බන්ධ මොඩියුල (Modules) පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම 37

4.6. ස්වයංක්‍රියකරණ ව්‍යාපෘති මඟින් පුස්තකාලවල වැඩි දියුණු කරන ලද පහසුකම් /සේවා 38

4.7. මහජන පුස්තකාල ස්වයංක්‍රියකරණය කිරීමේ ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය 38

4.7.1. ස්වයංක්‍රියකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයාම සහ අක්‍රියවීමට බලපා ඇති හේතු සාධක 40

4.8. ස්වයංක්‍රියකරණය කරන ලද පුස්තකාල වර්තමානයේදී මුහුණ පා ඇති ගැටලු හා අභියෝග 42


**පස්වන පරිච්ඡේදය**


05. පර්යේෂණයේ සොයාගැනීම්, නිර්දේශ සහ නිගමන 43-48

5.1 පර්යේෂණය මඟින් අනාවරණය වන ප්‍රධාන කරුණු සහ සොයාගැනීම් 43

5.2 නිර්දේශ 46

5.3 නිගමනය 48

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 49

ඇමුණුම 01: අධ්‍යයනයට ලක් කරන ලද ස්වයංක්‍රියකරණය/පරිගණක වැඩසටහන් භාවිතා කරනු ලබන පුස්තකාල ලැයිස්තුව 50-56

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 01. පුස්තකාල ස්වයංක්‍රීයකරණය

### 1.1 ස්වයංක්‍රීයකරණය

ස්වයංක්‍රීයකරණය යනු අවම මිනිස් මැදිහත්වීමකින් කාර්යයන් ඉටු කිරීම සඳහා තාක්ෂණය භාවිත කිරීමයි. ක්‍රියාවලීන් විධිමත් කිරීම, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මිනිස් උත්සාහය අඩු කිරීම සඳහා යන්ත්‍ර, පාලන පද්ධති සහ මෘදුකාංග යොදාගැනීම එයට ඇතුළත් වේ. නිෂ්පාදනය, සෞඛ්‍ය සේවා, ප්‍රවාහනය සහ තොරතුරු තාක්ෂණය (IT) වැනි ක්ෂේත්‍රවල ස්වයංක්‍රීයකරණය බහුලව භාවිත වේ.

නූතන සමාජය තුළ ස්වයංක්‍රීයකරණය පුළුල් කාර්යභාරයක් ඉටු කරයි. කාර්යයන් වේගයෙන් සහ ඉහළ නිරවද්‍යතාවයකින් නිම කිරීම තුළින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, මිනිස් ශ්‍රමය සහ දෝෂ අවම කිරීම තුළින් පිරිවැය අවම කිරීම, මිනිස් සහභාගීත්වය අඩු කිරීම මඟින් ආරක්ෂාව වැඩි කිරීම සහ ශ්‍රම බලකායේ සමානුපාතික වැඩිවීමකින් තොරව කාර්යයන් සිදු කිරීමට ව්‍යාපාරවලට ඉඩ සලසන බැවින් ඵලදායිතාව වැඩි කිරීම වැනි සුවිශේෂතා හේතුවෙන් ස්වයංක්‍රීයකරණය කෙරෙහි නූතන සමාජයේ වැඩි අවධානයක් යොමු වී ඇත. නූතන ලෝකය තුළ ස්වයංක්‍රීයකරණයේ විවිධ භාවිතයන් හඳුනාගත හැකිය. විවිධ නිෂ්පාදන ක්‍රියාවලි සඳහා රොබෝ තාක්ෂණය යොදා ගැනීම, සෞඛ්‍ය සේවාවලදී ස්වයංක්‍රීය රෝග විනිශ්චය සහ රොබෝ සැත්කම් ආදිය සිදු කිරීම, බැංකුකරණය සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) මත පදනම් වූ වංචා හඳුනා ගැනීම, සුපිරි වෙළඳසැල්වල ස්වයං පරීක්ෂා කිරීමේ යන්ත්‍ර, පාරිභෝගික සහාය සඳහා කෘත්‍රිම බුද්ධිය (AI) මඟින් ක්‍රියාත්මක වන චැට්බෝට් ආදී අවස්ථා මෙන්ම තොරතුරු තාක්ෂණ සහ මෘදුකාංග ක්ෂේත්‍රයේ දී ස්වයංක්‍රීය පරීක්ෂණ, පරිගණකකරණය සහ පුස්තකාල ක්ෂේත්‍රයේ දී පොත් සංසරණය සඳහා පුස්තකාල කළමනාකරණ පද්ධති වැනි අවස්ථා පමණක් නොව ස්මාර්ට් නිවාස (Smart homes) සහ ස්වයං පරීක්ෂා කිරීමේ කියෝස්ක් (Self-checkout kiosks) නූතන සමාජයේ ස්වයංක්‍රීයකරණය භාවිත කරන අවස්ථා පිළිබඳ උදාහරණ කිහිපයකි.

**ස්වයංක්‍රීයකරණයේ ප්‍රධාන අංග**

1. **ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය** - වැඩ ප්‍රවාහ සහ ව්‍යාපාර මෙහෙයුම් ස්වයංක්‍රීය කිරීම (උදා: දත්ත ඇතුළත් කිරීම, ඉන්වොයිස් සැකසීම)

2. **කාර්මික ස්වයංක්‍රීයකරණය** - නිෂ්පාදනයේදී රොබෝවරු සහ යන්ත්‍ර භාවිත කිරීම (උදා: එකලස් කිරීමේ මාර්ග, තත්ත්ව පාලනය)

3. **මෘදුකාංග ස්වයංක්‍රීයකරණය** - මෘදුකාංග භාවිතයෙන් ඩිජිටල් කාර්යයන් ස්වයංක්‍රීය කිරීම (උදා: චැට්බෝට්, AI මඟින් ක්‍රියාත්මක වන සහායකයින්)

4. **පුස්තකාල ස්වයංක්‍රීයකරණය** - පුස්තකාල සම්පත් සහ සේවාවන් කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණය යෙදීම

5. **ගෘහ ස්වයංක්‍රීයකරණය** - ආලෝකය, ආරක්ෂාව සහ උපකරණ පාලනය කරන ස්මාර්ට් උපාංග

**කෘත්‍රිම බුද්ධිය (AI), යන්ත්‍ර ඉගෙනීම (ML) සහ අන්තර්ජාලයේ දේවල් (IoT)** ආදී ක්ෂේත්‍රවල අඛණ්ඩ දියුණුවත් සමඟ ස්වයංක්‍රීයකරණය අඛණ්ඩව පරිණාමය වෙමින් විවිධ වෘත්තීන්වල මෙන්ම සමස්ත සමාජයේ ම අනාගතය හැඩගස්වන සාධකයක් බවට පත්ව ඇත.

## 1.2. ස්වයංක්‍රීයකරණයේ විකාශය සහ පුස්තකාල ස්වයංක්‍රීයකරණය

ස්වයංක්‍රීයකරණයට පුරාණ ශිෂ්ටාචාර දක්වා දිවෙන දිගු ඉතිහාසයක් ඇත. මුල් කාලීන ස්වයංක්‍රීයකරණය ජල ඔරලෝසු, සුළං බලයෙන් ක්‍රියාත්මක වන උපාංග සහ සරල යාන්ත්‍රික මෙවලම් ආකාරයෙන් සිදු විය. ක්‍රි.පූ. 3 වන සියවසේදී ග්‍රීක ඉංජිනේරුවෙකු වන සෙටෙසිබියස්, චලනය වන රූප සහිත ජලයෙන් ක්‍රියාත්මක වන ඔරලෝසු නිර්මාණය කර තිබේ. ක්‍රිස්තු වර්ෂ 1 වන සියවසේදී ඇලෙක්සැන්ඩ්‍රියානුවන් වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක වන උපාංග සහ යාන්ත්‍රික ස්වයංක්‍රීය යන්ත්‍ර නිර්මාණය කර ඇත. මධ්‍යකාලීන සහ පුනරුද සමය පිළිබඳ සලකා බැලීමේදී ඉස්ලාමීය ස්වර්ණමය යුගය ලෙස සැලකෙන 9 වන සියවසයේදී අල්-ජසාරි වැනි නව නිපැයුම්කරුවන් ජල බලයෙන් ක්‍රියාත්මක වන සංකීර්ණ යන්ත්‍ර සහ වැඩසටහන්ගත කළ හැකි ස්වයංක්‍රීය යන්ත්‍ර නිර්මාණය කර ඇත. 15-16 සියවස්වලදී ලියනාඩෝ ඩාවින්චි යාන්ත්‍රික නයිට්වරයෙකු ඇතුළු ස්වයංක්‍රීය යන්ත්‍ර සඳහා මෝස්තර සටහන් කළ බවට සාක්ෂි තිබේ. කාර්මික විප්ලවය සිදුවූ 18-19 සියවස් වලදී ස්වයංක්‍රීයකරණය නවමු ආරම්භයක් සනිටුහන් කරමින් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රචලිතවී ඇත. 1771 දී රිචඩ් ආර්ක්රයිට්ගේ ජල රාමු යාන්ත්‍රික රෙදිපිළි නිෂ්පාදනය, 1800 ගණන්වල අගභාගයේදී වාෂ්ප එන්ජින් මඟින් ස්වයංක්‍රීයව කර්මාන්තශාලා බල ගැන්වූ අතර එමඟින් ඵලදායිතාව වැඩි කර ඇත. රෙදිපිළි හා රෙදි විවීම ස්වයංක්‍රීය කිරීම සඳහා පන්ච් කාඩ්පත් භාවිත කළ ජැකාර්ඩ්ගේ රෙදි වියන යන්ත්‍රය (1804) වැනි යාන්ත්‍රික රෙදි වියන යන්ත්‍ර සංවර්ධනය කිරීම මෙම යුගවලදී සිදු කර ඇත. විදුලි හා ඩිජිටල් ස්වයංක්‍රීයකරණයේ නැගීම 20 වන සියවසේදී සිදු වී ඇත. 1921 දී **"රොබෝ"** යන වචනය මුලින්ම භාවිත කරන ලද්දේ චෙකෝස්ලෝවැකියානු අන්තර් කර්තෘ ලේඛිකාවක වන කැරල් චෙපක් විසින් රචිත "රොසොම්ගේ විශ්ව රොබෝවරු" (Rossum's Universal Robots) නාට්‍යයේය. 1940-50 අතර කාලවලදී මුල් පරිගණක සහ පාලන පද්ධති කාර්මික ස්වයංක්‍රීයකරණයේ විප්ලවීය වෙනසක් ඇති කර ඇත. 1956 වර්ෂයේදී පළමු කාර්මික රොබෝවරයා වන **"යුනිමේට්"** සංවර්ධනය කරන ලද අතර පසුව මෝටර් රථ නිෂ්පාදනයේදී භාවිත කරන ලදී. 1960-80 අතර කාලවකවානුවේදී වැඩසටහන්ගත කළ හැකි තාර්කික පාලක (Programmable Logic Controller**)** සහ පරිගණක ආධාරක නිෂ්පාදන (Computer Aided Manufacturing) වල වර්ධනය සිදු විය.

21 වන සියවසේදී කෘත්‍රිම බුද්ධිය (AI ) සහ ස්මාර්ට් ස්වයංක්‍රීයකරණය වසර 2000 ගණන්වල සිට වර්තමානය දක්වා AI, IoT (අන්තර්ජාල දේවල්) සහ රොබෝ විද්‍යාවේ දියුණුව හේතුවෙන් නිෂ්පාදන, සෞඛ්‍ය සේවා, මූල්‍ය ආදී ක්ෂේත්‍ර සහ දෛනික ජීවිතයේදී ද ප්‍රයෝජනවත්වන වඩාත් බුද්ධිමත් සහ දියුණු ස්වයංක්‍රීයකරණයක් ඇති වී තිබේ. 2010 වසර සිට වර්තමානය දක්වා රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (Robottic Process Automation) මඟින් මෘදුකාංග බොට් වලට පුනරාවර්තන ඩිජිටල් කාර්යයන් හැසිරවීමට හැකියාව ලැබී ඇත. අනාගතයේදී ස්වයං ඉගෙනුම් රොබෝවරු, ස්වයංක්‍රීය වාහන සහ ස්මාර්ට් නගර දක්වා අඛණ්ඩව පරිණාමය වෙමින් පවතී.

## 1.3. පුස්තකාල ස්වයංක්‍රීයකරණය

පුස්තකාල ස්වයංක්‍රීයකරණය යනු පුස්තකාල මෙහෙයුම් සහ සේවාවන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණය සහ මෘදුකාංග භාවිත කිරීමයි. ප්‍රතිග්‍රහණය, අනුක්‍රමණිකා හා ග්‍රන්ථ නාමාවලි සම්පාදනය, ග්‍රන්ථ සංසරණය, වාර සඟරා පාලනය, පුස්තකාල පරිපාලනය හා කළමනාකරණය, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය, දත්ත පදනම් ගවේෂණය, පාඨක සේවා සැපයීම හා යොමු ගත සේවා, ඩිජිටල් සම්පත් කළමනාකරණය සහ Radio Frequency Identification (RFID) ආරක්ෂණ පද්ධති වැනි පුස්තකාල කාර්යයන් පරිගණකගත කිරීම එයට ඇතුළත් වේ.

පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ අරමුණ වන්නේ පුස්තකාලයේ කාර්යයන් විධිමත් කිරීම, කාර්යක්ෂම කිරීම හා අවම මිනිස් මැදිහත්වීමකින් යුතුව කාර්යයන් ඉටුකිරීම ඩිජිටල් සහ භෞතික පුස්තකාල සම්පත් ඒකාබද්ධ කිරීම සහ සමස්ත පරිශීලක අත්දැකීම වැඩි දියුණු කිරීමයි.

**පුස්තකාල ස්වයංක්‍රීයකරණය** පිළිබඳ විවිධ මූලාශ්‍ර විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇත.

1. "පුස්තකාල ස්වයංක්‍රීයකරණය යනු පරිගණක සහ ඒ ආශ්‍රිත තාක්ෂණය යොදා ගනිමින් සාම්ප්‍රදායික පුස්තකාල කාර්යයන් වන නාමාවලීකරණය, සංසරණය සහ අත්පත් කර ගැනීම් සිදු කිරීම, ක්‍රියාවලින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා යොමු කිරීමයි."

   ***(හැරල්ඩ්ගේ පුස්තකාලයාධිපති පාරිභාෂික ශබ්දකෝෂය, 1995)***

2. "පුස්තකාල කාර්යයන් ඉටු කිරීම සඳහා පරිගණක, මෘදුකාංග සහ ජාලකරණය භාවිතය, මිනිස් ශ්‍රමය අඩු කිරීම සහ පුස්තකාල එකතු කිරීම් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම."

   ***(ALA: ඇමරිකානු පුස්තකාල සංගමය)***

3. "තොරතුරු සම්පත් කළමනාකරණයට පහසුකම් සැලසීම සහ පුස්තකාල සේවා වැඩි දියුණු කිරීම සඳහා පරිගණක සහ විදුලි සංදේශ භාවිතය හරහා පුස්තකාල යාන්ත්‍රිකකරණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ."

   ***(යුනෙස්කෝ: එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය)***

4. "පුස්තකාල ස්වයංක්‍රීයකරණය යනු නාමාවලීකරණය, සංසරණය, අත්පත් කර ගැනීම් සහ අනුක්‍රමික පාලනය වැනි සාමාන්‍ය පුස්තකාල කාර්යයන් ඉටු කිරීම සඳහා ස්වයංක්‍රීය සහ අර්ධ ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර භාවිත කිරීමයි."

   ***(සී.ජී. විශ්වනාදන්-පුස්තකාල විද්‍යා විශේෂඥ)***

ලොව පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ ආරම්භය සිදුවන්නේ 1931 ටෙක්සාස් (Texas) විශ්ව විද්‍යාලයීය පුස්තකාල ග්‍රන්ථ සංසරණයට සිදුරු පත් භාවිත කිරීමත් සමඟය. හැටේ දශකයේ අවසාන භාගයත් සමඟ ආරම්භ වූ කාල පරිච්ඡේදය පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්විය හැකිය (Rao, 1992).

වර්තමානයේදී පුස්තකාලය හා එහි සේවාවන් නව්‍යකරණය වෙමින් පවතින අතර පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ අවශ්‍යතාවය සෑම පුස්තකාලයකම දැකිය හැකි පොදු අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. පොත්, සඟරා, විද්‍යුත් සම්පත් සහ අනෙකුත් ද්‍රව්‍ය ක්‍රමානුකූලව සංවිධානය කිරීමට උපකාරී වීම, තොරතුරු ඉක්මනින් සහ පහසුවෙන් ලබා ගැනීම සහතික කිරීම මඟින් පුස්තකාල සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, කාලය ඉතිරි කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම, වැඩි දියුණු කළ පරිශීලක සේවා ලබාදීමේ හැකියාව, පරිශීලකයින්ට මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (Online Public Accsess Catalogue-OPAC) හරහා මාර්ගගතව පොත් සෙවීමට හැකියාව ලබා දීම, නිරවද්‍යතාවය සහ දෝෂ අඩු කිරීම, ග්‍රන්ථ සංසරණ පාලනය විධිමත් කිරීම, ඉන්වෙන්ටරි කළමනාකරණය, ඩිජිටල් සහ භෞතික සම්පත් ඒකාබද්ධ කිරීම, පිරිවැය ඵලදායීතාවය, දත්ත ආරක්ෂාව සහ Backup තබා ගැනීමේ හැකියාව, අනාගතයේ සිදුවන තාක්ෂණික නව්‍යතාවය (AI, cloud computing and mobile access) වලට අනුගතවීමේ හැකියාව ආදී සුවිශේෂතා හේතුවෙන් පුස්තකාල ස්වයංක්‍රීයකරණය සෑම පුස්තකාලයකම අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව ඇත.

පුස්තකාල ස්වයංක්‍රීයකරණය නූතන පුස්තකාල සඳහා හඳුන්වාදීම අත්‍යාවශ්‍ය අංගයක් වුවද පුස්තකාල ස්වයංක්‍රීයකරණයට යොමුවීම සම්බන්ධයෙන් බාධක හා දුෂ්කරතා රැසකට පුස්තකාලවලට මුහුණදීමට සිදුව ඇත. පරිගණක මෘදුකාංග හා දෘඩාංග පරිගණක, Barcode Scanner, RFID සහ ජාලකරණ යටිතල පහසුකම් මිලදී ගැනීම හා පද්ධති නඩත්තුව, වැඩි දියුණු කිරීම් සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ඉහළ ආරම්භක පිරිවැයක් දැරීමට සිදුවීම, පුස්තකාල කාර්යය මණ්ඩලයට ක්‍රියාත්මක වීමට තාක්ෂණික දැනුමක් හෝ පුහුණුවක් නොමැති වීම, කාර්යය මණ්ඩලයේ ආකල්ප හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, දත්ත සංක්‍රමණය කිරීමේ ගැටලු (Data Migration Issues), මෘදුකාංග තෝරා ගැනීමේදී පැන නඟින ගැටලු, ආරක්ෂක ගැටලු (Security Concerns), රජයේ හෝ ආයතනික සහයෝගය නොමැතිකම, නඩත්තු සහ තාක්ෂණික සහාය ගැටලු, අවම ඩිජිටල් සාක්ෂරතාවයක් ඇති පරිශීලකයින්ට ස්වයංක්‍රීය පුස්තකාල සේවා භාවිත කිරීමට අපහසු විය හැකි වීම හා අන්තර්ජාල ප්‍රවේශය නොමැති අවස්ථාවල ඩිජිටල් පහසුකම් සහ ප්‍රවේශවීමේ ගැටලු, මාර්ගගත පුස්තකාල සීමා වීම ආදී දුෂ්කරතා මත පුස්තකාල ස්වයංක්‍රීයකරණයට යොමුවීම ලෝකයේ ඇතැම් පුස්තකාලවලට තවමත් අභියෝගයක් වී ඇත.

## 1.4. ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය සැලකිය යුතු දියුණුවක් අත්කර ගෙන ඇති අතර, එමඟින් රට පුරා පුස්තකාල සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු වී ඇත. ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම ආරම්භ කිරීම සඳහා සුවිශේෂ දායකත්වයක් ලබාදුන් පුස්තකාල හා ආයතන කිහිපයක් හඳුනා ගත හැකිය.

1980 දශකයේ මුල් භාගයේදී ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු මධ්‍යස්ථානය (Sri Lanka Scientific and Technological Information Centre - SLSTIC) විසින් පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා මූලික පියවර ගෙන ඇති අතර 1983 වර්ෂයේදී පළමු කුඩා පරිගණකය වන WANG MVP 2200 මිලදීගෙන ඇති අතර SLSTIC ආයතනය විසින් පළමු පරිගණකස්ථ ඒකාබද්ධ සූචිය (Computerized Union Catalogue) නිර්මාණය කිරීමත් සමඟ මෙරට පුස්තකාලවල පරිගණක මඟින් ග්‍රන්ථ නාමාවලි ආශ්‍රිත දත්ත සැකසීමේ ආරම්භය සනිටුහන් කරන ලදි.

1983 ජනවාරි මස 23 වන දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් කොළඹ මහජන පුස්තකාලයේදී පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරු සමඟ සාකච්ඡාවක් පවත්වා ඇති අතර එහිදී ඒකාබද්ධ සූචිය පිළිබඳ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශේෂයෙන් සාකච්ඡා කර ඇත. 1986 වර්ෂයේදී යුනෙස්කෝ (UNESCO) සංවිධානය විසින් Micro CDS/ ISIS මෘදුකාංගය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම හා මෙම මෘදුකාංගය ශ්‍රී ලංකාව පුරා බෙදා හැරීමට ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානයට (SLISTIC) පවරා ඇත. CDS/ ISIS භාවිතයත් සමඟ ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණ කටයුතුවල දියුණුවක් දැකගත හැකි වේ. 1990 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම (National Science Foundation) මඟින්ද CDS/ ISIS මෘදුකාංගය සහ යුනෙස්කෝ ආයතනය විසින් පසුව හඳුන්වා දුන් WINISIS මෘදුකාංගය ලංකාවේ පුස්තකාල අතර ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කර ඇත. ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට මෙම මෘදුකාංගය හඳුන්වාදීමේදී මෙරට විසූ ප්‍රවීණ පුස්තකාලයාධිකාරීවරයෙකුවන එන්. යූ. යාපා මහතාගෙන් සිදුවූ සේවය අගය කළ යුතුය.

1990 වර්ෂයට පෙර විශේෂ පුස්තකාලවලත් 1990න් පසු විශ්වවිද්‍යාල පුස්තකාලවලත් පරිගණක භාවිතය ආරම්භ කර ඇත. 1990 අගෝස්තු මස 16 වන දින පළමු ස්වයංක්‍රීයකරණ කමිටුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී මහාචාර්ය ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇත.

1990 වර්ෂයේදී මොරටුව විශ්වවිද්‍යාලයේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සම්බන්ධ කරනු ලැබූ ලංකාවේ පළමු සන්නිවේදන ජාලයවන ලංකා අධ්‍යාපනික අධ්‍යයන සහ පර්යේෂණ ජාලය (LEARN- Lanka Education Academic Research Network) ගොඩනැංවීම සිදුකර ඇත.

ස්වයංක්‍රීයකරණයේ පුරෝගාමියෙකු වන මොරටුව විශ්වවිද්‍යාල පුස්තකාලය (UML), 1997 දී CDS/ISIS මෘදුකාංග භාවිතයෙන් එහි සූචිය ඩිජිටල්කරණය කිරීම ආරම්භ කර ඇත. 2001 වන විට, එය Libsys පද්ධතිය සමඟ සියලුම ප්‍රධාන පුස්තකාල කාර්යයන් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයකරණය කළ ශ්‍රී ලංකාවේ පළමු විශ්වවිද්‍යාල පුස්තකාලය බවට පත්විය. 2008 වසරේදී RFID මත පදනම් වූ ආරක්ෂක පද්ධතියක් හඳුන්වා දීමෙන් මොරටුව විශ්වවිද්‍යාල පුස්තකාලය එහි ස්වයංක්‍රීයකරණ සේවාවන් තවදුරටත් වැඩි දියුණු කර ඇත.

කොළඹ විශ්වවිද්‍යාලය විසින් 2022 සැප්තැම්බර් මාසයේදී, කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතිය (University of Colombo Library Information Management System-UCLIMS) ආරම්භ කර ඇත. මෙම පද්ධතිය සියලුම විශ්වවිද්‍යාල පුස්තකාලවලින් සිදුකරන එකතු කිරීම් ඒකාබද්ධ කිරීම, මාර්ගගත පොත් වෙන් කිරීම්, මිලදී ගැනීම් සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් බහුභාෂා සෙවුම් හැකියාවන් වැනි විශේෂාංග සහිතව ස්වයංක්‍රීයකරණ සේවා සපයනු ලබයි.

පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා පුස්තකාල ස්වයංක්‍රීයකරණ මෘදුකාංගයක් භාවිත කිරීම අත්‍යාවශ්‍ය වේ. ලෝකයේ විවිධ පුස්තකාල ස්වයංක්‍රීයකරණ මෘදුකාංග බිහිවී ඇති අතර වාණිජ මෘදුකාංග හා අර්ධ වාණිජ මෘදුකාංග, හුදෙකලා මෘදුකාංග හා අනුකලිත මෘදුකාංග, නිදහස් මෘදුකාංග හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග වශයෙන් හඳුනා ගත හැකි මෙම පුස්තකාල මෘදුකාංග ඒ ඒ පුස්තකාලයේ අවශ්‍යතාවය හා ශක්‍යතාවය අනුව භාවිත කළ හැකිය. පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල හා අනිකුත් පුස්තකාලවල භාවිත කරන වාණිජ මෘදුකාංග ලෙස Libsuit, Libsys, Alice for Windows හා බහුලව භාවිත කරන විවෘත මූලාශ්‍ර මෘදුකාංග ලෙස KOHA, ISURU වැනි මෘදුකාංග හඳුනාගත හැකිය.

1995 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ රාජ්‍ය හා පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති හරහා ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සිදු කර ඇත.

විශේෂයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සැලකිය යුතු සංඛ්‍යාවක් ස්වයංක්‍රීයකරණය කිරීම සිදු කර ඇති අතර එම ව්‍යාපෘතිවලට අමතරව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ එක් සේවාවක් ලෙස, ඉල්ලුම් කරන පුස්තකාල සඳහා KOHA මෘදුකාංගය ස්ථාපනය කර ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා අවශ්‍ය සේවා සපයාදීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘති මගින් ස්වයංක්‍රීයකරණය කරන ලද ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කරන අතර එම ව්‍යාපෘති හරහා සිදුකරන ලද ස්වයංක්‍රීයකරණ කාර්යයන් වල සාර්ථක අසාර්ථකභාවය, එම සම්පත් සහ සේවාවල භාවිතය, වර්තමාන තත්වය, ගැටලු සහ අනාගත අවශ්‍යතා හඳුනාගැනීම මෙන්ම ස්වයංක්‍රීයකරණය කර ඇති ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පිළිබඳ පසුවිපරමක් සිදු කිරීම මෙම පර්යේෂණය මගින් මූලික වශයෙන් අපේක්ෂා කරනු ලැබේ.

## 1.5. පර්යේෂණ අරමුණු

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම හා එම පුස්තකාලවල වර්තමාන තත්වය විමසා බැලීම පිළිබඳ මෙම සමීක්ෂණය මගින් අපේක්ෂිත පර්යේෂණ අරමුණු පහත පරිදිය.

- ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණය කරන ලද සහ ස්වයංක්‍රීයකරණය නොකරන ලද මහජන පුස්තකාල හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා කටයුතු කරන විවිධ ව්‍යාපෘති/වැඩසටහන් මොනවාද යන්න හඳුනා ගැනීම සහ එම ව්‍යාපෘතිවල වත්මන් තත්වය විමසා බැලීම.
- මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා දියත් කරන ලද ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය හා එමගින් එම පුස්තකාලවල පහසුකම් සහ සේවා නව්‍යකරණය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම.
- ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල ලෙස ක්‍රියාත්මක වීමේදී මුහුණ පා ඇති ගැටලු අභියෝග හා අනාගත අවශ්‍යතා සම්බන්ධයෙන් විමසා බැලීම.
- ශ්‍රී ලංකාවේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය ආශ්‍රිත ගැටලු හා අභියෝග නිරාකරණය කර ගැනීමට ගත යුතු පියවර සහ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණ ගැනිමට අවශ්‍ය නිර්දේශ හා නිගමන ඉදිරිපත් කිරීම.

## 1.6. සමීක්ෂණය මඟින් අවධානය යොමු කරනු ලබන ක්ෂේත්‍ර

- මහජන පුස්තකාලවල භෞතික හා මානව සම්පත් පිළිබඳ තොරතුරු
- පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළ පසුබිම් තොරතුරු හා වර්තමාන තත්වය (ස්වයංක්‍රීයකරණය කරන ලද කාලපරිච්ඡේදය, දත්ත පදනමට ඇතුළත් කර ඇති මූලාශ්‍ර සංඛ්‍යාව, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා ප්‍රමාණය, සාමාජික තොරතුරු)
- ස්වයංක්‍රීයකරණය කර තිබෙන පුස්තකාල විසින් භාවිත කරනු ලබන මෘදුකාංග (Software) සහ පරිගණක වැඩසටහන් (Computer Programmes)
- ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා කටයුතු කරන ලද ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති/වැඩසටහන්
- එම ව්‍යාපෘති යටතේ පුස්තකාලයේ පහසුකම් හා සේවා වැඩි දියුණු වූ ආකාරය
- කොහා (KOHA) මෘදුකාංගය භාවිත කරනු ලබන පුස්තකාලවල භාවිත කරන මොඩියුල් වර්ග
- ස්වයංක්‍රීයකරණය හරහා සේවා සපයන මොඩියුල පිළිබඳව පාඨකයින්ගේ දැනුවත්භාවය
- ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මක වීමේදී වර්තමානයේදී මුහුණ පා ඇති ගැටලු හා අභියෝග
- පවතින ගැටලු විසඳීම සඳහා යෝජනා සහ නිර්දේශ

## 1.7. අධ්‍යයනයේ වැදගත්කම සහ පර්යේෂණ ගැටලුව

පුස්තකාල ස්වයංක්‍රීයකරණය මඟින් සාම්ප්‍රදායික පුස්තකාල කාර්යයන් වඩාත් කාර්යක්ෂමව සහ ආරක්ෂිතව පාඨකයාගේ කාලය ඉතිරි කරමින් සිදු කිරීමට හැකියාව ලැබී ඇත. පරිගණක තාක්ෂණය හා නව තොරතුරු තාක්ෂණික ක්‍රමවේද පුස්තකාලවල භාවිත කිරීම මඟින් පුස්තකාලවල සම්පත් හා සේවාවන් නවතාවයකින් යුතුව උපයෝජකයින් වෙත ලබාදීමට වර්තමානයේදී ශ්‍රී ලංකාවේ බොහෝ පුස්තකාල කටයුතු කර ඇත. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය ස්වයංක්‍රීයකරණයවීමේ ප්‍රවණතාවක් වර්තමානයේදී දැකිය හැකි අතර ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට අයත්වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල රාජ්‍ය, පළාත් පාලන ආයතන හා විවිධ ව්‍යාපෘති/වැඩසටහන් මඟින් ස්වයංක්‍රීයකරණය කිරීම සිදුකරමින් පවතී.

පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය තුළ වැදගත් ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගත හැකි අතර එමඟින් තොරතුරු වෙත ළඟා වීමේ සහ තොරතුරු බෙදා හැරීමේ ක්‍රමවේදය විධිමත් වී ඇත. පසුගිය කාලවකවානුව තුළදී ශ්‍රී ලංකාව පුරා විවිධ ව්‍යාපෘති/වැඩසටහන් මඟින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා කටයුතු කර තිබේ. මෙම ව්‍යාපෘති මඟින් ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම මහජන පුස්තකාලවල සම්පත් සහ සේවා නව්‍යකරණය වී ඇති ආකාරය හා එම පුස්තකාලවල වර්තමාන තත්වය පිළිබඳව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය කර ගැනීමට අපේක්ෂිතය. ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල පිළිබඳ යාවත්කාලීන තොරතුරු නිසිපරිදි වාර්තා නොවීම හේතුවෙන් මෙවැනි සමීක්ෂණයක් තුළින් එම තොරතුරු අනාවරණය කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැකිය.

විවිධ ව්‍යාපෘති/වැඩසටහන් මඟින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම මඟින් වර්තමානයේදී එම පුස්තකාලවල පුස්තකාල කළමනාකරණය විධිමත් කිරීම, තාක්ෂණික සේවා නව්‍යකරණය වී ඇති ආකාරය සහ තොරතුරු සේවා සැපයීමේ කාර්යයන් කාර්යක්ෂමව සහ සාර්ථකව සිදු කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. මහජන පුස්තකාල වෙත විවිධ තොරතුරු අවශ්‍යතා සඳහා පැමිණෙන විවිධ වර්ගවලට අයත් උපයෝජකයින්ට සේවා සැපයීමේදී, ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම පුස්තකාලවල ක්‍රියාත්මක සුවිශේෂී සේවාවන් සහ පාඨකයින්ට එම සේවාවල ඇති ප්‍රයෝජනවත්භාවය සහ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ දීප ව්‍යාප්ත තත්වය සහ තොරතුරු ඇගයීමේ අවශ්‍යතාව මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

## 1.8. පර්යේෂණ ක්‍රමවේදය

### 1.8.1. නියැදිය

මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ ක්‍රමවේදය (Survey Method) යොදාගෙන ඇත. ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව පවතින පුස්තකාල අතරින්, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල මෙම සමීක්ෂණයට අදාළ නියැදිය ලෙස සලකා දත්ත ලබා ගන්නා ලදී. එම පුස්තකාල වෙත මාර්ගගත (Online) ප්‍රශ්නාවලියක් (Google form) යොමුකර පිළිතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදි. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහජන පුස්තකාල වෙත මාර්ගගතව ප්‍රශ්නාවලි 1,176 ක් පමණ යොමු කරන ලද අතර ප්‍රතිචාර සහිතව ලද පිළිතුරු ප්‍රශ්නාවලි සංඛ්‍යාව 635කි. එය ප්‍රතිශතයක් ලෙස 54.% කි.

වගු අංක 01 : ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල සංඛ්‍යාව

| පළාත් පාලන ආයතනය | ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| මහ නගර සභා | 47 | 7.4 |
| නගර සභා | 49 | 7.6 |
| ප්‍රාදේශීය සභා | 539 | 85 |
| එකතුව | 635 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

### 1.8.2. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය

මෙම පුස්තකාලවලට අදාළ දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික දත්ත මූලාශ්‍රයක් ලෙස ප්‍රශ්නාවලියක් (Google form) මාර්ගගතව (Online) ඉදිරිපත් කර පිළිතුරු මාර්ගගතව ලබා ගත් අතර ප්‍රතිචාර සහිතව ලද පිළිතුරු ප්‍රශ්නාවලි සංඛ්‍යාව 635කි. ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස ග්‍රන්ථ, සඟරා, පර්යේෂණ ලිපි හා අදාළ වෙබ් අඩවි පරිශීලනය කරන ලදී.

සමීක්ෂණය ඔස්සේ ලබාගත් දත්ත ඇතුළත් කිරීමට හා විශ්ලේෂණය සඳහා SPSS (Statistical Package for Social Sciences) මෘදුකාංගය හා MS Excel ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද දත්ත පදනම් හරහා පිළිතුරු ප්‍රශ්නාවලි 635කට අදාළ දත්ත ඇතුළත්කර සංස්කරණය කිරීම කරන ලදි. සමීක්ෂණයට අදාළ අරමුණු හා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශ්ලේෂණය කරන ලද දත්ත, වගු, ප්‍රස්ථාර හා රූපසටහන් භාවිතයෙන් ඉදිරිපත් කර ඇත.

# දෙවන පරිච්ඡේදය

# දත්ත විශ්ලේෂණය

## 2.1. පුස්තකාල පිළිබඳ මූලික තොරතුරු

### 2.1.1. පළාත් පාලන ආයතන අනුව පුස්තකාල ව්‍යාප්තිය


ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතට ගැනෙන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා අනුව ප්‍රතිචාර දක්වා තිබෙන මහජන පුස්තකාලවල ව්‍යාප්තිය පහත වගු අංක 02 මඟින් දක්වා ඇත.

වගු අංක 02 ඃ පළාත් පාලන ආයතන අනුව ප්‍රතිචාර ලබා දුන් මහජන පුස්තකාලවල ව්‍යාප්තිය

| පළාත් පාලන ආයතනය | පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| මහ නගර සභා | 47 | 7.4 |
| නගර සභා | 49 | 7.7 |
| ප්‍රාදේශීය සභා | 539 | 84.9 |
| එකතුව | 635 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ප්‍රතිචාර දක්වන ලද සමස්ත පුස්තකාල ප්‍රමාණය 635ක් වේ. ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල අතරින් බහුතර පුස්තකාල ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන අතර, එම ප්‍රමාණය 539ක් වේ. එය ප්‍රතිශතයක් ලෙස 84.9% කි. ඊට අමතරව නගර සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාල ප්‍රමාණය 7.7% (49)ක් වන අතර මහ නගර සභා යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල ප්‍රමාණය 7.4% (47)ක් බව ඉහත වගු අංක 02 අනුව හඳුනා ගත හැකිය.




රූප සටහන 01 ඃ පළාත් පාලන ආයතන අනුව ප්‍රතිචාර ලබා දුන් මහජන පුස්තකාලවල ව්‍යාප්තිය
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

## 2.2. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම

වර්තමාන සමාජයෙහි පුස්තකාල භාවිතය අවම වෙමින් පවතින අතර, රට තුළ කියවීමේ සංස්කෘතියක් ඇති කිරීම සඳහා මෙන්ම ජනතාවගේ තොරතුරු සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා මහජන පුස්තකාල තවදුරටත් සවිබල ගැන්විය යුතුව ඇත. පුස්තකාල ස්වයංක්‍රීයකරණය, පුස්තකාල ඩිජිටල්කරණය වැනි නව තාක්ෂණික සංවර්ධනයන් හරහා ජනතාවට දැනුම සහ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය කිරීම හා නව පහසුකම් සැලසීම තුළින්, සමාජ සහ ආර්ථික සංවර්ධනයට දායකවන තොරතුරු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාකිරීමට මහජන පුස්තකාලවලට හැකි වේ.


ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල හරහා පුළුල් සේවාවන් රැසක් ජනතාව වෙත ලබාදීමේ අරමුණින් ඒ ඒ පළාත් පාලන ආයතනවලට අයත්වන මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා පසුගිය කාල වකවානුවේදී විවිධ ව්‍යාපෘති හරහා කටයුතු කර ඇත. රජය, ඒ ඒ පළාත් පාලන ආයතන සහ විවිධ විශ්වවිද්‍යාල, රාජ්‍ය හා පුද්ගලික ආයතනවල මැදිහත්වීමෙන් සිදු කරන ලද මෙම ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති හරහා ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට කටයුතු කර ඇත.

මෙම පරිච්ඡේදයේදී, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය තුළ මේ වන විට ස්වයංක්‍රීයකරණය කර ඇති මහජන පුස්තකාල, එම පුස්තකාල සතු සම්පත්, ස්වයංක්‍රීයකරණය කර ඇති කාලපරිච්ඡේදය, සුචිය පරිගණක ගත කිරීම, ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කිරීම සිදුකර ඇති මෘදුකාංගය/පරිගණක වැඩසටහන, පුස්තකාල පරිගණකගත කර ඇති ව්‍යාපෘතිය/වැඩසටහන සම්බන්ධව මෙන්ම එම ව්‍යාපෘතිය/වැඩසටහන ඔස්සේ ඒ ඒ පුස්තකාල වෙත ලැබුණු සම්පත් පිළිබඳව අධ්‍යයනය කෙරේ.

ප්‍රතිචාර දක්වන ලද සමස්ත පුස්තකාල ප්‍රමාණය වන පුස්තකාල 635 අතරින් ස්වයංක්‍රීයකරණය කර ඇති පුස්තකාල ලෙස මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා ආදී පළාත් පාලන ආයතනවලට අයත් ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කළ පුස්තකාල 156 ක් පිළිබඳ තොරතුරු මෙම සමීක්ෂණය ඔස්සේ හඳුනාගත හැකි විය. අනිකුත් පුස්තකාල 479 ස්වයංක්‍රීයකරණය කර නොමැති පුස්තකාල ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව මෙම වාර්තාවේදී, ස්වයංක්‍රීයකරණය කර ඇති පුස්තකාල ලෙස ප්‍රතිචාර දක්වා ඇති පුස්තකාල 156 ට අදාළ දත්ත විශ්ලේෂණය කර ඉදිරිපත් කරනු ලැබේ.

### 2.2.1. පළාත් පාලන ආයතනවලට අයත් ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාලවල ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සම්බන්ධව සිදු කරන ලද මෙම සමීක්ෂණය ඇසුරින් ඒ ඒ පළාත් පාලන ආයතනවලට අයත් ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල හා එම පුස්තකාලවල වර්තමාන තත්වය පිළිබඳව අවධානය යොමු කරන ලදි.




රූප සටහන අංක 02 : මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා වශයෙන් පළාත් පාලන ආයතන යටතට ගැනෙන, ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවල ව්‍යාප්තිය පිළිබඳව සලකා බලන විට, ස්වයංක්‍රීයකරණය කර ඇති බහුතර පුස්තකාල ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා යටතට අයත් පුස්තකාල වේ. එම අගය මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 58.3% (91) කි. දෙවනුව ස්වයංක්‍රීයකරණය කිරීමට ලක්ව ඇති වැඩිම පුස්තකාල ප්‍රමාණය නගර සභාවලට අයත්වන පුස්තකාල වන අතර එම අගය 21.2% (33) කි. මහ නගර සභාවලට අයත් මහජන පුස්තකාල 20.5% (32)ක් ස්වයංක්‍රීයකරණය කර ඇති බව අනාවරණය වේ.


### 2.2.2. ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල සතු පොත් එකතු

මෙම සමීක්ෂණය මඟින් ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල සතු පොත් එකතු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

වගු අංක 03 : ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල සතු පොත් එකතු

| පොත් සංඛ්‍යාව | පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 5000ට අඩු | 5 | 3.2 |
| 5000-9000 | 18 | 11.5 |
| 10000-14999 | 40 | 25.7 |
| 15000-19999 | 25 | 16.0 |
| 20000-24999 | 13 | 8.3 |
| 25000-29999 | 17 | 10.9 |
| 30000-34999 | 12 | 7.7 |
| 35000-39999 | 8 | 5.1 |
| 40000-44999 | 4 | 2.6 |
| 45000-49999 | 2 | 1.3 |
| 50000ට වැඩි | 12 | 7.7 |
| මුළු එකතුව | 156 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025




රූප සටහන 03 : ස්වයංක්‍රීයකරණය කළ මහජන පුස්තකාල සතු මුළු පොත් එකතුව
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත ප්‍රස්ථාර අංක 03 ට අනුව ස්වයංක්‍රීයකරණය කළ මහජන පුස්තකාල සතු පොත් එකතු පිළිබඳ සලකා බැලීමේදී, පොත් 10,000 – 14,999 කාණ්ඩයට අයත් පොත් ප්‍රමාණයක් සහිත පුස්තකාල වැඩිම අගයක් ගන්නා අතර එය ප්‍රතිශතයක් ලෙස 25.7% (40) අගයකි. එමෙන්ම පොත් 15,000 – 19,999 සතු කාණ්ඩයට අයත් පුස්තකාලවල ප්‍රතිශතය 16% කි. පොත් 5,000 – 9,000 සතු කාණ්ඩයට අයත් ප්‍රතිශතය 16% කි. පොත් 25,000 – 29,999 කාණ්ඩයට අයත් පුස්තකාලවල ප්‍රතිශතය 10.9% කි. පොත් 40,000 – 44,999 (2.6%) සහ පොත් 45,000-49,999 (1.3%) කාණ්ඩයන්හි අවම පොත් සංඛ්‍යාවක් පවතී. වැඩිම මුළු පොත් එකතුව එනම් පොත් 50,000 ට වැඩි එකතු පහත පුස්තකාල ආශ්‍රිතව දැක ගත හැකිය.

වගු අංක 04 : ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල අතරින් වැඩිම පොත් එකතු පවතින පුස්තකාල

| මහජන පුස්තකාලය | මුළු පොත් එකතුව |
|---|---|
| කොළඹ මහජන පුස්තකාලය | 200,889 |
| යාපනය මහජන පුස්තකාලය | 292,163 |
| ගාල්ල රිචඩ් පතිරණ මහජන පුස්තකාලය | 137,900 |
| දෙහිවල ගල්කිස්ස මහජන පුස්තකාලය | 80,000 |
| කුරුණෑගල මහජන පුස්තකාලය | 73,412 |
| මාතර මහජන පුස්තකාලය | 72,973 |
| අනුරාධපුර මහජන පුස්තකාලය | 71,908 |
| නුවරඑළිය මහජන පුස්තකාලය | 70,256 |
| මීගමුව මහජන පුස්තකාලය | 58,100 |
| පිළියන්දල මහජන පුස්තකාලය | 53,000 |
| අතුරුගිරිය මහජන පුස්තකාලය | 50,890 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

යාපනය මහජන පුස්තකාලය සහ කොළඹ මහ නගර සභා පුස්තකාල සතුව ලක්ෂ දෙකකට අධික පුස්තකාල පොත් එකතුවක් පවත්වාගෙන යන බව අනාවරණය වේ. එමෙන්ම ඉහත සඳහන් කර තිබෙන පුස්තකාලවල සැලකිය යුතු පොත් එකතුවක් පවත්වාගෙන යන අතර, මෙම පුස්තකාලවල කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම හේතුවෙන් තම පාඨකයන් වෙත ක්‍රමවත් මෙන්ම ඵලදායි සේවාවක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

### 2.2.3. බැහැර දෙන අංශයට අයත් පොත් එකතුව

ග්‍රන්ථ සංසරණය මහජන පුස්තකාලයක ප්‍රධානතම කාර්යයක් වන අතර ස්වයංක්‍රීයකරණය මඟින් එම කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට හැකි වේ. ස්වයංක්‍රීයකරණය කර ඇති මෙම මහජන පුස්තකාලවල බැහැරදෙන අංශයට අයත් පොත් එකතුව පිළිබඳව දත්ත ලබා ගන්නා ලදි.

වගු අංක 05 : බැහැර දෙන අංශයට අයත් පොත් එකතුව


| පොත් එකතුව | පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 5000 අඩු | 13 | 8.5 |
| 5000-9999 | 41 | 26.1 |
| 10000-14999 | 32 | 20.5 |
| 15000-19999 | 24 | 15.4 |
| 20000-24999 | 18 | 11.5 |
| 25000 වැඩි | 24 | 15.4 |
| ප්‍රතිචාර දක්වා නොමැති | 04 | 2.6 |
| මුළු එකතුව | 156 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

වගු අංක 05ට අනුව පැහැදිලි වන්නේ ස්වයංක්‍රීයකරණය කළ මහජන පුස්තකාල අතරින් බහුතර පුස්තකාල ප්‍රමාණයක් බැහැරදෙන අංශය සතු පොත් 5,000 – 9,999 ඇති කාණ්ඩයට අයත් වන අතර එම අගය 26.1% කි. තවද, බැහැරදෙන අංශය සතු පොත් 10,000 -14,999 කාණ්ඩයේ පවතින පුස්තකාල සංඛ්‍යාව 20.5% ක් වේ. පොත් 15,000 – 19,999 සහ 25000 ට වැඩි කාණ්ඩවලට අයත්ව පවතින පුස්තකාල ප්‍රමාණය 15.4% ක් වේ. බැහැර දෙන අංශයට අයත් අවම පොත් ප්‍රමාණය වන 5,000 ට අඩු පොත් ප්‍රමාණයක් පවතින පුස්තකාල සංඛ්‍යාව 8.5% කි. ස්වයංක්‍රීයකරණය කළ මහජන පුස්තකාල අතරින් සැලකිය යුතු පුස්තකාල සංඛ්‍යාවක් බැහැරදෙන අංශය විධිමත්ව පවත්වාගෙන යන බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය විය.

### 2.2.4. වාර සඟරා එකතුව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව

යාවත්කාලීන තොරතුරු පාඨක ප්‍රජාව වෙත ලබාදීම සඳහා වාර සඟරා එකතුවක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. එමෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුවක් පවත්වාගෙනයාම සාමාන්‍ය පාඨකයින්ට මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත පාඨක ප්‍රජාවට සේවා සැලසීමේදී ද ඉතා වැදගත් වේ. මෙම සමීක්ෂණය මඟින් ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාලවල පවත්වාගෙන යනු ලබන වාර සඟරා එකතුව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලදි.




රූප සටහන 04 : ස්වයංක්‍රීයකරණය කළ මහජන පුස්තකාල සතු වාර සඟරා එකතුව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන් අංක 04 ට අනුව ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල සතු වාර සඟරා එකතුව සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ, මෙම මහජන පුස්තකාලවල පවත්වාගෙන යනු ලබන සඟරා එකතුව, සඟරා 100 ට අඩු ප්‍රමාණයක් සහිත පුස්තකාල ප්‍රමාණය 72.6% කි. වාර සඟරා 100 – 500 අතර ප්‍රමාණයකින් යුතු පුස්තකාලවල ප්‍රතිශතය 5.4%කි. මෙම පුස්තකාලවල වාර සඟරා අංශ ක්‍රියාත්මකවුවද, සඟරා නාම කිහිපයක් පමණක් මිලදී ගැනීම සිදුවන බව අනාවරණය වේ. නව සඟරා මිලදී ගැනීමට සහ මාර්ගගත සඟරා සඳහා පාඨකයින් යොමු කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති අවධානය අවම බව ඉහත දත්ත අනුව අනාවරණය වේ.

තවද, මෙම මහජන පුස්තකාලවල ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය එකතු පිළිබඳ ලබාගත් දත්ත අනුව, ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන 100 ට වඩා අඩු ප්‍රමාණයකින් යුතු පුස්තකාල සංඛ්‍යාව, ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල අතරින් 75.6% කි. තවද ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය 100 -500 අතර ප්‍රමාණයක් පවතින පුස්තකාල ප්‍රමාණය 5.8% ක් වන අතර ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව 501 – 1000 අතර ප්‍රමාණයක් සහිත පුස්තකාල ප්‍රමාණය 3.8% කි. මෙම දත්ත අනුව, ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාලවලින් වැඩි පුස්තකාල ප්‍රමාණයක පවතින ශ්‍රව්‍ය දෘශ්‍ය එකතු භෞතිකව අවම අගයක පවතින බව අනාවරණය වේ.

## 2.3. පුස්තකාලය භාවිත කරන ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව


පුස්තකාලය පරිහරණය කරන පාඨක ප්‍රජාව, පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේදී මූලිකවම සලකා බලනු ලබන සාධකයකි. විශේෂයෙන් මහජන පුස්තකාල භාවිත කරන පාඨකයින් විවිධ වන අතර කිසිදු භේදයකින් තොරව පුස්තකාලයට පැමිණෙන සෑම පාඨකයෙකුගේම විවිධ තොරතුරු අවශ්‍යතා පූර්ණය කිරීමේදී පුස්තකාල කාර්යය මණ්ඩලයට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවන අතර, පුස්තකාල ස්වයංක්‍රීයකරණ කිරීම මඟින් එම සේවා පහසුවෙන් කාර්යක්ෂමව හා ආරක්ෂිතව සිදු කිරීමට හැකිවී ඇත.

වගු අංක 06 : පුස්තකාලය භාවිත කරන ක්‍රියාකාරී සාමාජිකයන් සංඛ්‍යාව

| **ක්‍රියාකාරී සාමාජිකයන් සංඛ්‍යාව** | **පුස්තකාල සංඛ්‍යාව** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| 2500 අඩු | 66 | 42.3 |
| 2500-5000 | 31 | 19.9 |
| 5000-7500 | 10 | 6.4 |
| 7500-10000 | 5 | 3.2 |
| 10000 වැඩි | 18 | 11.5 |
| සඳහන් කර නොමැති | 26 | 16.7 |
| එකතුව | 156 | 100 |

ඉහත වගු අංක 06 ට අනුව මෙම මහජන පුස්තකාල 156 අතරින් 5000 අඩු සාමාජිකයින් සිටින සහ සාමාජිකයන් 5000 ට වැඩියෙන් සිටින පුස්තකාල ලෙස කොටස් 02 ක් ඔස්සේ වර්ගීකරණය කර දැක්විය හැකිය. ඒ අනුව ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කළ පුස්තකාල අතරින් සාමාජිකයන් 5000ට වැඩියෙන් සිටින පුස්තකාල ප්‍රමාණය 33 (21.2%) ක් වේ. 5000 අඩු සාමාජිකයින් සිටින පුස්තකාල ප්‍රමාණය 97 (62.2%) කි. ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල අතරින් බහුතර පුස්තකාල ප්‍රමාණයක් සාමාජිකයින් 5000 ට අඩු සංඛ්‍යාවක් සිටින පුස්තකාල බව ඉහත දත්ත අනුව අනාවරණය වේ.

## 2.4. මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කිරීම් සිදු කර ඇති කාල පරිච්ඡේදය




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල ප්‍රමාණය | 0.6 | 2.6 | 3.2 | 4.5 | 19.9 | 10.3 | 9.6 | 5.8 | 10.3 | 9.6 | 23.1 | 0.7 |

රූප සටහන අංක 05 : මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කිරීම් සිදු කර ඇති කාල පරිච්ඡේදය

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන අංක 05 ට අනුව මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා ගැනීම සඳහා සිදු කර ඇති පූර්ව වැඩසටහන් පිළිබඳව සලකා බැලීමේදී බහුතරයක් පුස්තකාල 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘති/වැඩසටහන් ඔස්සේ ස්වයංක්‍රීයකරණය කිරීමේ කාර්යය ආරම්භ කර තිබෙන බව අනාවරණය වේ. එම ප්‍රතිශතය 19.9% කි. 2017 වර්ෂයට පෙර ස්වයංක්‍රීයකරණය හෝ පුස්තකාල පරිගණකගත කිරීමේ කටයුතු ඉතා මන්දගාමීව සිදුව ඇති ස්වභාවයක් ඉහත දත්ත වලින් පෙනී යයි. තවද 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල වැඩිම සංඛ්‍යාවක් ස්වයංක්‍රීයකරණයට/පරිගණකගත කිරීමට ලක්ව ඇති බව මෙම සමීක්ෂණය මගින් අනාවරණය වී ඇත.


## 2.5. ස්වයංක්‍රියකරණය/පරිගණකගත කිරීමේ ක්‍රියාවලියේදී යොදාගෙන තිබෙන පරිගණක මෘදුකාංග/පරිගණක වැඩසටහන්

පුස්තකාල ස්වයංක්‍රියකරණ කිරීමේදී ඒ සඳහා සුදුසු මෘදුකාංගයක් යොදා ගැනීම අත්‍යාවශ්‍ය වේ. වර්තමානයේ පුස්තකාල ස්වයංක්‍රියකරණ කටයුතු සඳහා බහුලව යොදාගනු ලබන ස්වයංක්‍රියකරණ මෘදුකාංගය වන්නේ "කොහා" (KOHA) මෘදුකාංගයයි. විවෘත මූලාශ්‍ර මෘදුකාංගයක් (Open Source Software) වන KOHA මෘදුකාංගය නොමිලේ භාවිත කිරීමට ඇති හැකියාව මෙන්ම ක්‍රමලේඛ (Programming Language) සඳහා ප්‍රවේශවීමට, සංවර්ධනය කිරීමට හා බෙදාහැරීමට ඇති හැකියාව හේතුවෙන්, වර්තමානයේදී බොහෝ මහජන පුස්තකාලද KOHA මෘදුකාංගය භාවිත කිරීමට පෙළඹී ඇත. මෙම මෘදුකාංගයට අමතරව ස්වයංක්‍රියකරණය හා පරිගණකගත කිරීම් කටයුතු වලදී ප්‍රාදේශීය වශයෙන් හෝ පළාත් පාලන ආයතන මට්ටමින් කාර්යයන් පහසුකරණය සඳහා, ඒ ඒ ආයතන මට්ටමින් පරිගණක මෘදුකාංග හෝ පරිගණක වැඩසටහන් නිර්මාණය කොට මහජන පුස්තකාල වෙත හඳුන්වා දීම සිදු කර තිබේ.

මෙම සමීක්ෂණයෙන් ලබාගත් දත්ත අනුව වයඹ සංවර්ධන අධිකාරිය මඟින් එම පළාතේ මහජන පුස්තකාල සඳහා වයඹ සංවර්ධන අධිකාරී පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය (CAT 2020) නමින් මෘදුකාංගයක් හඳුන්වා දී ඇත. වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක බොහෝ මහජන පුස්තකාල මෙම මෘදුකාංගය මඟින් පුස්තකාල එකතු පරිගණකගත කිරීම සිදු කර ඇත. මෙම මෘදුකාංගය භාවිතයෙන් පොත් මිලදී ගැනීමේ කටයුතු, ග්‍රන්ථ සංසරණය, සාමාජික කාඩ්පත් හා දඩ නිකුත් කිරීම වැනි කටයුතු මෙන්ම පුස්තකාලයේ පොත් ගවේෂණය වැනි කටයුතු ද සිදු කරන බව අනාවරණය විය.

එමෙන්ම මධ්‍යම පළාත් සභාව මඟින් එම පළාත් සභාව යටතේ පාලනය වන මහජන පුස්තකාලවලට "කඩියා" (KADIYA) නමින් පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දි ඇති අතර එම පුස්තකාලවල කාර්යයන් පහසුකරණය සඳහා මෙන්ම විශේෂයෙන් පොත් සමීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කර ගැනීම සඳහා මෙම මෘදුකාංගය භාවිත කරනු ලබයි. මෙම මෘදුකාංගය මඟින් පුස්තකාල ස්වයංක්‍රියකරණ මොඩියුල කිහිපයක් සඳහා පමණක් පහසුකම් සලසා ඇති බව හඳුනා ගත හැකි වේ. මීට අමතරව, ග්‍රන්ථලිබ් (Granthalib) මෘදුකාංගය, ඊ-පුරනැගුම වැඩසටහන යටතේ භාවිත කරනු ලබන පුරනැගුම E- Software, බලංගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල විසින් භාවිත කරන බලංගොඩ මහජන පුස්තකාලයීය කළමනාකරණ දත්ත පද්ධතිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවිය මඟින් හඳුන්වා දී ඇති මෘදුකාංගය ආදී වශයෙන් විවිධ පළාත්වල ඒ ඒ පළාත් පාලන ආයතන වෙත විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රාදේශීය වශයෙන් හඳුන්වා දී ඇති විවිධ මෘදුකාංග එම මහජන පුස්තකාල ස්වයංක්‍රියකරණය/පරිගණකගත කිරීමේ කටයුතු සඳහා යොදාගෙන තිබෙන බව අනාවරණය වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල මහජන පුස්තකාල විසින් ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතු සඳහා විවිධ පරිගණක මෘදුකාංග හෝ පරිගණක වැඩසටහන් භාවිත කර ඇති බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය වන අතර එම පුස්තකාලවල ව්‍යාප්තිය පහත රූප සටහන මඟින් නිරූපනය කර ඇත.




රූප සටහන අංක 06 : ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල මහජන පුස්තකාල විසින් ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කිරීමේ කටයුතු සඳහා භාවිත කර ඇති පරිගණක මෘදුකාංග/පරිගණක වැඩසටහන්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ප්‍රතිචාර දක්වන ලද පුස්තකාල 156 අතරින් පුස්තකාල 132 ක් කොහා මෘදුකාංගය යොදා ගනිමින් ස්වයංක්‍රීයකරණ කටයුතු සිදු කර ඇත. ඒ අනුව ප්‍රතිශතයක් ලෙස, මහජන පුස්තකාල 84.6% ක (132) ප්‍රමාණයක් ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා කොහා මෘදුකාංගය භාවිත කර ඇති බව අනාවරණය වේ. තවද මහජන පුස්තකාල 5.8% ක ප්‍රමාණයක් (9) “ කඩියා” පරිගණක වැඩසටහන යොදාගෙන තිබේ. තවද 3.8% ක් (5) පුරනැගුම පරිගණක වැඩසටහන භාවිත කර ඇති අතර වයඹ සංවර්ධන අධිකාරිය මඟින් හඳුන්වා දෙන ලද වයඹ පුස්තකාල සංවර්ධන වැඩසටහන යොදාගනිමින් වයඹ පළාතේ පුස්තකාල 4.5% ක් (7) පරිගණකගත කිරීමේ කටයුතු සිදු කර ඇත. මීට අමතරව 1.9% ක (3) පුස්තකාල සංඛ්‍යාවක් ග්‍රන්ථලිබ් (Granthalib) මෘදුකාංගය මඟින් පරිගණකගත කිරීමේ කටයුතු සිදුකර ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල අතරින් වැඩිම පුස්තකාල සංඛ්‍යාවක් භාවිත කර ඇති මෘදුකාංගය KOHA මෘදුකාංගය බව අනාවරණය වේ.

## 2.6. ස්වයංක්‍රීකරණය කිරීමේ කටයුතු සිදු කරන ලද විවිධ ව්‍යාපෘති/වැඩසටහන්

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා කටයුතු කරන ලද විවිධ ව්‍යාපෘති පිළිබඳ මෙම සමීක්ෂණය මඟින් අවධානය යොමු කරන ලදි. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා පහත දක්වා ඇති ප්‍රධාන ව්‍යාපෘති හරහා මෙන්ම විවිධ වැඩසටහන් කිහිපයක් මඟින් කටයුතු කර ඇති බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය වේ.

1. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය
2. එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ වැඩසටහන
3. විවෘත විශ්වවිද්‍යාලය හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් දියත් කරන ලද ව්‍යාපෘතිය
4. අදාළ පුස්තකාලය මඟින් විවෘත විශ්වවිද්‍යාලයෙහි සම්පත් දායකත්වය ලබා ගැනීම ඔස්සේ සිදු කරන ලද ව්‍යාපෘති
5. ආසියානු සංවර්ධන බැංකුව මඟින් පුස්තකාලවලට සිදුකරන ලද ප්‍රදානයන් ඔස්සේ සිදු කරන ලද ව්‍යාපෘති
6. මහජන පුස්තකාල මඟින් එම පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන මත දියත් කරන ලද ව්‍යාපෘති
7. රුහුණු ක්‍රියේෂන්ස් (Ruhunu Creations) ආයතනය මඟින් සිදු කළ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය
8. රුහුණු සොෆ්ට් සොලුෂන්ස් (Ruhunu Soft Solutions) ආයතනය මඟින් සිදු කළ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය
9. මහජන පුස්තකාලවල ඉල්ලීම් අනුව, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සිදුකරනු ලබන ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති
10. CEYMarc ආයතනය මඟින් සිදුකරන ලද පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය
11. පළාත් පාලන ආයතන මට්ටමින් සිදු කරන ලද ව්‍යාපෘති


ඉහත සඳහන් කරන ලද ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාවට නංවා තිබෙන කාලපරිච්ඡේදය පිළිබඳ විමසීමේදී පසුගිය ආසන්න වසර 10 තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වී ඇති බව අනාවරණය වේ. විශේෂයෙන්ම මෙම බොහෝ ව්‍යාපෘති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මැදිහත්වීමෙන් සිදු කර ඇති අතර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදෙස් සහ මඟපෙන්වීම අනුව අමාත්‍යාංශ, වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ උසස් අධ්‍යාපනික ආයතන සමඟ සහයෝගීව, දේශීය/විදේශීය ආධාර සපයන ආයතනවල ද මූල්‍ය ආධාර සහිතව මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

මෙම සමීක්ෂණය තුළින් අනාවරණය වන පරිදි ඉහත ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති මඟින් ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවල තොරතුරු පහත (වගු අංක 07) මඟින් දක්වා ඇත.

වගු අංක 07 : ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතු කරන සිදු කරන ලද විවිධ ව්‍යාපෘති/වැඩසටහන් හා එම ව්‍යාපෘති යටතේ ස්වයංක්‍රීයකරණය කර ඇති පුස්තකාල සංඛ්‍යාව

| ස්වයංක්‍රීයකරණ/පරිගණකගත කිරීමේ කටයුතු කරන ලද ව්‍යාපෘති/ වැඩසටහන් | ස්වයංක්‍රීයකරණය කර ඇති පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය | 25 | 16 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ වැඩසටහන | 18 | 11.5 |
| විවෘත විශ්වවිද්‍යාලය හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් දියත් කරන ලද මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය | 14 | 9 |
| පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන මත විවිධ බාහිර ආයතන මඟින් තාක්ෂණික උපදේශකත්වය ලබා ගනිමින් දියත් කරන ලද ව්‍යාපෘති | 63 | 40.4 |
| රුහුණු ක්‍රියේෂන්ස් (Ruhunu Creations) ආයතනය මඟින් සිදු කළ ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය. | 6 | 3.8 |
| රුහුණු සොෆ්ට් සොලුයුෂන්ස් (Ruhunu Soft Solutions) ආයතනය මඟින් සිදු කළ ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය. | 3 | 2 |
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් පුස්තකාලවල ඉල්ලීම මත සිදුකරනු ලබන මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය | 1 | 0.6 |
| CEYMarc ආයතනය මඟින් | 2 | 1.3 |
| වෙනත් (පළාත් පාලන ආයතන මට්ටමින් සහ වෙනත් ආයතන සමඟ සහසම්බන්ධව සිදු කළ ව්‍යාපෘති ) | 24 | 15.4 |
| එකතුව | 156 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2025





රූප සටහන අංක 07 : ස්වයංක්‍රීයකරණ /පරිගණකගත කිරීමේ කටයුතු කරන ලද ව්‍යාපෘති/වැඩසටහන් හා එම පුස්තකාල සංඛ්‍යාව

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන අංක 07ට අනුව පැහැදිලි වන පරිදි, බහුතර පුස්තකාල ප්‍රමාණයක් පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන මත විවිධ බාහිර ආයතන ඔස්සේ තාක්ෂණික උපදේශකත්වය ලබා ගනිමින් ස්වයංක්‍රීයකරණ කටයුතු සිදු කර ඇති බව අනාවරණය වේ. එය ප්‍රතිශතයක් ලෙස, සමස්ත ප්‍රතිචාර අතරින් 40.4% (63). ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය මඟින් පුස්තකාල 25 ක් ස්වයංක්‍රීයකරණය කරන ලද අතර එය සමස්ත ප්‍රතිචාර අතරින් 16% ප්‍රතිශතයකි. ඊට අමතරව පුස්තකාල පරිගණකගත කිරීම සිදුකරනු ලබන වෙනත් වැඩසටහන් ඔස්සේ සිදු කරන ලද ව්‍යාපෘති (පළාත් පාලන ආයතන මට්ටමින් සහ වෙනත් ආයතන සම්බන්ධ කර ගනිමින් සිදු කළ) මඟින් පුස්තකාල 24 එනම් 15.4% ක් පරිගණක ගත කර ඇත. තවද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කරන ලද පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ වැඩසටහන

යටතේ පුස්තකාල 18 (11.5%) ක්, විවෘත විශ්වවිද්‍යාලය සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් දියත් කරන ලද ව්‍යාපෘතිය යටතේ පුස්තකාල 14 (9%) ක් රුහුණු ක්‍රියේෂන්ස් (Ruhunu Creations) ආයතනය මඟින් පුස්තකාල 6 (3.8%) ක්, රුහුණු සොෆ්ට් සොලුයුෂන්ස් (Ruhunu Soft Solutions) ආයතනය මඟින් පුස්තකාල 3 (2%) ක්, CEYMarc ආයතනය මඟින් පුස්තකාල 2 (1.3%) සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සිදුකරන ලබන මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය යටතේ එක් පුස්තකාලයක් (0.6%) ස්වයංක්‍රීයකරණය කර ඇති බව මෙම සමීක්ෂණ දත්ත මඟින් අනාවරණය වේ.




රූප සටහන අංක 08 : පළාත් පාලන ආයතන මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන මත ස්වයංක්‍රීයකරණය /පරිගණකගත කිරීමේ කටයුතු කරන ලද ව්‍යාපෘති/වැඩසටහන්

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත සඳහන් විවිධ ව්‍යාපෘති/වැඩසටහන් සමඟ සහසම්බන්ධව මෙම මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සිදු කර තිබුණ ද බහුතර පුස්තකාල සංඛ්‍යාවක් එම මහජන පුස්තකාලවලට අයත් පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා) මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන මත පදනම්ව අදාළ මෘදුකාංග භාවිතය සඳහා සහ අනිකුත් කටයුතු සඳහා මාර්ගෝපදේශ සපයනු ලබන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහාය ලබාගනිමින් පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළ කටයුතු සිදු කර තිබෙන බව පැහැදිලි වේ. ඒ අනුව මෙම මහජන පුස්තකාල විසින් අදාළ පළාත් පාලන ආයතනයන මඟින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගනිමින් විවෘත විශ්වවිද්‍යාලය, රුහුණු ක්‍රියේෂන්ස් (Ruhunu Creations) ආයතනය, රුහුණු සොෆ්ට් සොලුයුෂන්ස් (Ruhunu Soft Solutions) ආයතනය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, CEYMarc ආයතනය වැනි රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ටෙන්ඩර් කැඳවීම් සිදුකිරීම මඟින් ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා අවශ්‍ය සේවාවන් ලබා ගෙන ඇත.

තවද ඉහත සඳහන් කල ව්‍යාපෘතිවලට අමතරව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් විවෘත විශ්වවිද්‍යාල පුස්තකාලයෙහි තාක්ෂණික උපදේශකත්වය ලබා ගනිමින් පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. එම පළාත්වලට අයත් මහජන පුස්තකාලවල සම්පත් හා සේවා පුස්තකාල අතර හුවමාරුකර ගැනීමට පුස්තකාල ජාලයක් (Public Library Network - Pubnet) නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රධාන අරමුණ වූ බව මෙම සමීක්ෂණයේදී අනාවරණය විය. මෙහි මුල් අදියර යටතේ විවිධ පළාත් ආශ්‍රිතව තෝරාගත් පුස්තකාලවල ස්වයංක්‍රීයකරණ කටයුතු 2016 – 2018 කාලපරිච්ඡේදයේදී සිදු කර ඇත.

සමීක්ෂණ දත්ත අනුව 2016 – 2018 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි තාක්ෂණික උපදේශකත්වය ලබා ගනිමින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන මත කොහා මෘදුකාංගය යොදාගනිමින් මහජන පුස්තකාල 30 ක් ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද 2018 වර්ෂයේදී, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත විවෘත විශ්වවිද්‍යාලයෙහි තාක්ෂණික උපදේශකත්වය මත කොහා මෘදුකාංගය යොදා ගනිමින් මහජන පුස්තකාල 14 ක් ස්වයංක්‍රීයකරණය කර තිබේ. තවද, 2015 – 2020 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි තාක්ෂණික උපදේශකත්වය මත පළාත් පාලන ආයතන මඟින් ‘‘කොහා’’ මෘදුකාංගය ඇසුරින් මහජන පුස්තකාල 19 ක් ස්වයංක්‍රීයකරණයට ලක් කර තිබේ (Marasinghe, I. 2022).

2018 වර්ෂයේදී, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ විවෘත විශ්වවිද්‍යාලයෙහි තාක්ෂණික උපදේශකත්වය මත කොහා මෘදුකාංගය යොදා ගනිමින් ස්වයංක්‍රීයකරණය කර තිබෙන මහජන පුස්තකාල 14 පහත දක්වා ඇත.

1. අතුරුගිරිය මහජන පුස්තකාලය
2. බෙල්මන්ට් මහජන පුස්තකාලය
3. බණ්ඩාරවෙල මහ නගර සභා මහජන පුස්තකාලය
4. හලාවත මහජන පුස්තකාලය
5. දෙහිවල මධ්‍ය පුස්තකාලය
6. දෙනියාය මහජන පුස්තකාලය
7. බණ්ඩාරනායක මහජන පුස්තකාලය, හිගුරක්ගොඩ
8. කිරින්ද පුහුල්වැල්ල මහජන පුස්තකාලය
9. මොරටුව මහජන පුස්තකාලය
10. නල්ලූර් මහජන පුස්තකාලය
11. නුගේගොඩ මහජන පුස්තකාලය
12. පදියතලාව මහජන පුස්තකාලය
13. බණ්ඩාරනායක අනුස්මරණ මහජන පුස්තකාලය, පාදුක්ක
14. තැන්නේකුඹුර මහජන පුස්තකාලය

මීට අමතරව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව දියත් කළ "ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය" යටතේ යාවත්කාලීන කරන ලද කොහා මෘදුකාංගය භාවිත කරමින් දිවයිනේ විවිධ පළාත් නියෝජනය වන පරිදි මහජන පුස්තකාල 25 ක් ස්වයංක්‍රීයකරණය කිරීමට කටයුතු කර තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ එම පුස්තකාල සඳහා පරිගණක සහ අදාළ උපාංග (ටැබ්ලට්, ඩෙක්ස්ටොප් පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර) සහ අන්තර්ජාල පහසුකම් සපයා දීම මෙන්ම, පුස්තකාල ස්වයංක්‍රීයකරණය හා ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධයෙන් පුස්තකාල කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවීම් ලබා දීම ද සිදු කර ඇත. තවද මෙම පුස්තකාලවල යටිතල පහසුකම් හා ස්මාර්ට් උපකරණ, ඩිජිටල් එකතු, අනුකලිත පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධති සංවර්ධනය, තොරතුරු වලට සම්බන්ධවීම හා ප්‍රවේශය සහ එම පුස්තකාල යටතේ කටයුතු කරනු ලබන කාර්යය මණ්ඩලය පුහුණු කිරීම සහ අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර තිබේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව දියත් කළ "ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය" යටතේ ස්වයංක්‍රීයකරණය කර ඇති මහජන පුස්තකාල 25 පහත පරිදි වේ.

01. කොළඹ මහජන පුස්තකාලය
02. සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය, බදුල්ල
03. මඩකලපුව මහජන පුස්තකාලය
04. කුරුණෑගල මහජන පුස්තකාලය
05. පුලතිසි බුද්ධිමණ්ඩප මහජන පුස්තකාලය, පොළොන්නරුව
06. කිරිමැටියාන මහජන පුස්තකාලය
07. වේයන්ගොඩ මහජන පුස්තකාලය
08. හොරණ මහජන පුස්තකාලය
09. රුවන්වැල්ල මහජන පුස්තකාලය
10. දොළුව මහජන පුස්තකාලය
11. දියතිලක මහජන පුස්තකාලය, හඟුරන්කෙත
12. ගලේවෙල මහජන පුස්තකාලය
13. නොච්චියාගම මහජන පුස්තකාලය
14. අම්බලන්ගොඩ මහජන පුස්තකාලය
15. හක්මණ මහජන පුස්තකාලය
16. හම්බන්තොට මහජන පුස්තකාලය
17. බිබිල මහජන පුස්තකාලය
18. අම්පාර මහජන පුස්තකාලය
19. මන්නාරම මහජන පුස්තකාලය
20. වෙන්ගලචෙඩ්ඩිකුලම් මහජන පුස්තකාලය
21. උප්පුවේලි මහජන පුස්තකාලය
22. පේදුරුතුඩුව මහජන පුස්තකාලය
23. පුදුකුඩිඉරිප්පු මහජන පුස්තකාලය
24. වඩ්ඩකච්චි මහජන පුස්තකාලය
25. ඕපනායක මහජන පුස්තකාලය

සමීක්ෂණ දත්ත මඟින් තවදුරටත් අනාවරණය වන පරිදි, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමඟ ඒකාබද්ධව මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහජන පුස්තකාල 18 ක් ස්වයංක්‍රීයකරණය කර තිබේ. මෙහිදී, ශ්‍රී ලංකාවේ ඌව, උතුර, නැගෙනහිර සහ උතුරුමැද පළාත් නියෝජනය වන පරිදි තෝරාගත් මහජන පුස්තකාල 18 ක් සඳහා කොහා මෘදුකාංගය භාවිතයෙන් ස්වයංක්‍රීයකරණ කටයුතු ක්‍රියාත්මක කර තිබේ. මේ යටතේ එම පුස්තකාල වෙත පරිගණක සහ පරිගණක උපාංග ලබාදීම, කොහා අනුකලිත පුස්තකාල කලමනාකරණය පද්ධතිය (ILMS) ලබාදිම, KOHA ILMS සඳහා Lanka Government Cloud පහසුකම් ලබාදීම, අන්තර්ජාල පහසුකම් සැපයීම සහ එම පුස්තකාල කාර්යමණ්ඩලය KOHA ILMS සහ ඊ-පුස්තකාල සේවා සම්බන්ධව පුහුණු කිරීම හා දැනුවත් කිරීම සිදු කර තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ ඒ ඒ පළාත් නියෝජනය වන පරිදි ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාල 18 පහත දැක්වේ.

01. ගල්නෑව මහජන පුස්තකාලය
02. කහටගස්දිගිලිය මහජන පුස්තකාලය
03. මැදිරිගිරිය මහජන පුස්තකාලය
04. උහන මහජන පුස්තකාලය
05. බුත්තල මහජන පුස්තකාලය
06. සියඹලාණ්ඩුව මහජන පුස්තකාලය
07. මහියංගණය මහජන පුස්තකාලය
08. රිදීමාලියද්ද මහජන පුස්තකාලය
09. ත්‍රිකුණාමලය මහජන පුස්තකාලය
10. කින්නියා මහජන පුස්තකාලය
11. තඹුලුවිල් මහජන පුස්තකාලය
12. එරාවුර් මහජන පුස්තකාලය
13. පේතාලෙයි මහජන පුස්තකාලය
14. කුමන්කුලම් මහජන පුස්තකාලය
15. චාවකච්චේරි මහජන පුස්තකාලය
16. චන්කානෙයි මහජන පුස්තකාලය
17. මුලතිව් මහජන පුස්තකාලය
18. පූනරීන් මහජන පුස්තකාලය

## තෙවන පරිච්ඡේදය


## 03. ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති යටතේ මහජන පුස්තකාල සංවර්ධනය කිරීම

### 3.1. ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති යටතේ පුස්තකාල වෙත ලබාදී ඇති භෞතික සම්පත්

මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළ කාර්යයන් සඳහා එම පුස්තකාලවල භෞතික සම්පත් සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කර ඇත. ඒ යටතේ එම පුස්තකාල වෙත ඩෙක්ස්ටොප් පරිගණක (Desktop Computers), ටැබ් පරිගණක (Tabs), සර්වර්ස් (Servers), බාකෝඩ් ප්‍රින්ටර්ස් (Barcode Printers), ඡායා පිටපත් යන්ත්‍ර (Photocopy Machines) සහ බාකෝඩ් රීඩර්ස් (Barcode Readers) ආදී නව තාක්ෂණික උපකරණ හා මෘදුකාංග ලබා දීම සිදු කර තිබේ.

මෙම අධ්‍යයනය ඔස්සේ ස්වයංක්‍රීයකරණය කර තිබෙන එම මහජන පුස්තකාල සඳහා ඉහත සඳහන් කරන ලද නව තාක්ෂණික උපකරණ හා මෘදුකාංග පුස්තකාලවලට බෙදා දී ඇති ආකාරය සහ ප්‍රමාණාත්මක වශයෙන් එම උපාංගවල ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කරන ලදී.

#### 3.1.1. ලැප්ටොප්, ඩෙස්ක්ටොප් හා ටැබ් පරිගණක ලබා දීම




| | පරිගණක 1-3 | පරිගණක 4- 6 | පරිගණක 7-9 | පරිගණක 10+ | පරිගණක නොමැති |
|---|---|---|---|---|---|
| ලැප්ටොප් පරිගණක | 35.2 | 1.3 | 0 | 0 | 63.5 |
| ඩෙස්ක්ටොප් පරිගණක | 36.4 | 10 | 11 | 5.1 | 37.2 |
| ටැබ් පරිගණක | 1.3 | 12.2 | 1.3 | 3.2 | 82 |


රූප සටහන අංක 09 : ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල සතු ලැප්ටොප්, ඩෙක්ස්ටොප්, ටැබ් පරිගණක සංඛ්‍යාව

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන අංක 09ට අනුව ස්වයංක්‍රීයකරණය කරන ලද මහජන පුස්තකාලවල පවතින ලැප්ටොප්, ඩෙස්ක්ටොප් හා ටැබ් පරිගණක ප්‍රමාණයන් පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය. පුස්තකාලවල පවතින සමස්ත පරිගණක ප්‍රමාණය පිළිබඳ විමසා බැලීමේදී, වැඩි පුස්තකාල ප්‍රමාණයක් සඳහා ඩෙස්ක්ටොප් පරිගණක ලබා දී ඇති බව අනාවරණය වේ. ලබා දී ඇති ලැප්ටොප් පරිගණක සහ ටැබ් පරිගණක ප්‍රමාණය ඊට සාපේක්ෂව අවම අගයක් ගනී. ප්‍රමාණාත්මකව පවතින පරිගණක කෙරෙහි අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ඩෙස්ක්ටොප් පරිගණක 1-3 ත් අතර ප්‍රමාණයක් පවතින පුස්තකාල 36.4% ක් වන අතර ඊට සාපේක්ෂව සලකා බැලීමේදී ලැප්ටොප් පරිගණක පවතින පුස්තකාල ප්‍රමාණය 35.2% කි. එම කාණ්ඩයේ අවම අගයක් ගනු ලබන්නේ ටැබ් පරිගණක වන අතර එම පුස්තකාල සංඛ්‍යාව 1.3% ක් වේ. තවද පරිගණක 4-6 කාණ්ඩයේ පවතින පුස්තකාල දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ඒ ආශ්‍රිතව පවතින ටැබ් පරිගණක සංඛ්‍යාව සෙසු පරිගණකවලට වඩා වැඩි අගයක් ගන්නා බවයි. ඊට අමතරව පරිගණක 10ට වඩා වැඩියෙන් ඇති පුස්තකාලවල ඩෙස්ක්ටොප් හා ටැබ් පරිගණක පමණක් ඇති බව ඉහත දත්ත අනුව පැහැදිලි වේ. එම සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස, පිළිවෙලින් ඩෙස්ක්ටොප් පරිගණක පවතින පුස්තකාල 5.1% ක් හා ටැබ් පරිගණක සහිත පුස්තකාල ප්‍රමාණය 3.2%කි. මීට අමතරව ඉහත සඳහන් පරිගණක වර්ග නොමැති පුස්තකාල පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ වැඩි පුස්තකාල ප්‍රමාණයක ටැබ් පරිගණක නොමැති බවයි. එම අගය සමස්ත ප්‍රතිචාර අතරින් 82% කි. ලැප්ටොප් පරිගණක නොමැති පුස්තකාල සංඛ්‍යාව 63.5% ක් සහ ඩෙක්ස්ටොප් පරිගණක නොමැති පුස්තකාල සංඛ්‍යාව 37.2% ක් වන බව ඉහත දත්ත අනුව අනාවරණය වේ.

### 3.1.2. සර්වර් (Server) පහසුකම් ලබා දීම

මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේදී එම පුස්තකාල සඳහා අවශ්‍ය සර්වර් (Server) පහසුකම් සපයා දීම ද සිදු කර තිබේ. එම සර්වර් (Server) පහසුකම් ස්ථාපිත කිරීමේදී භෞතික (Physical) හා අතථ්‍ය (Virtual) සර්වර්ස් වශයෙන් වර්ග දෙකක් ලබාදී ඇති බව අනාවරණය වේ. මුල්කාලීනව එනම් 2021 වර්ෂයට පෙර ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල වැඩි ප්‍රමාණයක් භෞතික සර්වර් පහසුකම් ලබාදී ස්වයංක්‍රීයකරණය කර ඇත.




රූප සටහන අංක 10 : සර්වර් (Server) පහසුකම්
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025


2021 වර්ෂයෙන් පසුව ස්වයංක්‍රියකරණය කරන ලද පුස්තකාල වෙත සර්වර් (Server) පහසුකම් ලබා දීමේදී එම පුස්තකාල අතරින් සර්වර් පහසුකම යටතේ Cloud Platform මඟින් සර්වර් ස්ථාපිත කර ඇති බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය වේ. ඉහත රූප සටහන අංක 10 ට අනුව ප්‍රතිචාර දක්වන ලද මහජන පුස්තකාල අතරින් සර්වර් පහසුකම් ක්‍රියාත්මක වන ප්‍රතිශතය 58.3% ක් වන අතර සර්වර් පහසුකම් ක්‍රියාත්මක නොවන පුස්තකාලවල ප්‍රතිශතය 41.7% ක් බව අනාවරණය වේ.

### 3.1.3. බාර්කෝඩ් ප්‍රින්ටර්ස් (Barcode Printers), බාර්කෝඩ් රීඩර්ස් (Barcode Readers) සහ ඡායා පිටපත් යන්ත්‍ර (Photocopy Machines) ලබා දීම

මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති හරහා එම පුස්තකාල වෙත ලබාදුන් නව තාක්ෂණික මෙවලම් යටතේ පොත් පිරිසැකසුම් කටයුතුවලදී නව තාක්ෂණය භාවිතයට ගැනීම තුළින් එම කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා බාර්කෝඩ් ප්‍රින්ටර්ස් (Barcode Printers) ලබා දීම ද සිදු කර තිබේ. ප්‍රතිචාර දක්වන ලද සමස්ත පුස්තකාල අතරින් බහුතර පුස්තකාල ප්‍රමාණයක් එනම් පුස්තකාල 64.6% ක බාර්කෝඩ් ප්‍රින්ටර්ස් 1-3 අතර ප්‍රමාණයක් ඇති අතර, පුස්තකාල 35.4% ක බාර්කෝඩ් ප්‍රින්ටර්ස් නොමැති බව අනාවරණය වේ.

පුස්තකාල සේවා පවත්වාගෙන යාමේදී ඡායා පිටපත් යන්ත්‍ර භාවිතය තුළින් එම සේවාවන් පහසු වන අතර මුල් පිටපත ආරක්ෂා කර ගැනීමට ද හැකියාව ලැබේ. මෙම පුස්තකාල ආශ්‍රිතව පවතින ඡායා පිටපත් යන්ත්‍ර ප්‍රමාණය විමසීමේදී ඡායා පිටපත් යන්ත්‍ර 1-3ත් අතර පවතින පුස්තකාල සංඛ්‍යාව 31% ක් වන අතර, ඡායා පිටපත් යන්ත්‍ර 4-6ත් අතර පවතින පුස්තකාල සංඛ්‍යාව 2% කි. එමෙන්ම බහුතර පුස්තකාල ප්‍රමාණයක, එනම් පුස්තකාල 67% ක ඡායා පිටපත් යන්ත්‍ර නොමැති බව ද අනාවරණය වේ.

පුස්තකාලයක සේවා සැපයීමේදී මෙන්ම පොත් පරිග්‍රහණය, තොග කළමනාකරණය වැනි තාක්ෂණික කටයුතු වලදී මෙන්ම ග්‍රන්ථ සංසරණයේදී ද යොදා ගත හැකි නව තාක්ෂණික මෙවලමක් ලෙස බාර්කෝඩ් රීඩර්ස් (Barcode Readers) යොදා ගැනීම තුළින් එම කාර්යයන් කාර්යක්ෂමව හා නිවැරදිව සිදු කළ හැකි වේ. මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති හරහා එම පුස්තකාලවලට බාර්කෝඩ් රීඩර්ස් ලබාදීමට ද කටයුතු කර ඇති අතර මෙම සමීක්ෂණයේදී එම මෙවලම් පිළිබඳව ද අවධානය යොමු කරන ලදි.




රූප සටහන අංක 11 : පුස්තකාල සතු බාර්කෝඩ් රීඩර්ස් (Barcode Readers)
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන අංක 11 ට අනුව ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම පුස්තකාල 156 අතරින් පුස්තකාල 68% ක බාර්කෝඩ් රීඩර්ස් එම පුස්තකාල සේවා පවත්වාගෙන යාමට භාවිත කරනු ලබයි. බාර්කෝඩ් රීඩර්ස් 1-3 අතර ප්‍රමාණයක් පවතින පුස්තකාල ප්‍රමාණය 51% ක් වන අතර බාකෝඩ් රීඩර්ස් 4-6 අතර ප්‍රමාණයක් සහිත පුස්තකාල 16% ක් ඇත. මීට අමතරව පුස්තකාල 1.3% ක අවම බාර්කෝඩ් රීඩර්ස් 10 ක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් ඇත. පුස්තකාල 32.1% ක බාර්කෝඩ් රීඩර්ස් නොමැති අතර එම පුස්තකාල පරිගණක වැඩසටහන් පමණක් ක්‍රියාත්මක වන පුස්තකාල බව අනාවරණය විය.

## සිව්වන පරිච්ජේදය

## 04. ස්වයංක්‍රීයකරණයට අදාළ මූලික කාර්යයන් සිදු කිරීම හා පුස්තකාලවල වැඩි දියුණු කරන ලද පහසුකම්

මෙම පුස්තකාල විසින් ස්වයංක්‍රීයකරණයට අදාළව සිදුකළ යුතු ප්‍රධානතම කාර්යය වශයෙන් ප්‍රධාන සුචිය පරිගණකගත කිරීම සඳහා දත්ත පදනම් සකස් කිරීම හා දත්ත ඇතුළත් කර ඇති ප්‍රමාණය සම්බන්ධයෙන් ද මෙම සමීක්ෂණය ඔස්සේ අවධානය යොමු කරන ලදි.

### 4.1. දත්ත පදනම් සංවිධානය හා ඇතුළත් කර ඇති මූලාශ්‍ර

පොත්, පුවත්පත්, සඟරා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර මෙම පුස්තකාල සතුව පවතින අතර ප්‍රධාන වශයෙන් දත්ත පදනමට ඇතුළත් කර ඇති පොත් සංඛ්‍යාව පිළිබඳ සමීක්ෂණය මඟින් විමසන ලදි.

වගු අංක 09 : දත්ත පදනමට ඇතුළත් කර ඇති පොත් සංඛ්‍යාව

| පොත් සංඛ්‍යාව | පුස්තකාල සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 1,000ට අඩු | 4 | 2.6 |
| 1,000-4,999 අතර | 17 | 10.9 |
| 5,000-9,999 අතර | 48 | 30.8 |
| 10,000ට වැඩි | 82 | 52.6 |
| ප්‍රතිචාර දක්වා නොමැති | 5 | 3.2 |


මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත වගු අංක 09 ට අනුව දත්ත පදනම්වලට ඇතුළත් කර ඇති පොත් එකතුව 10,000 ට වැඩි ප්‍රමාණයක් සහිත පුස්තකාල වැඩි ප්‍රමාණයක් ඇති බව සමීක්ෂණ දත්ත අනුව පැහැදිලි වේ. එය 52.6% ක ප්‍රතිශතයකි. තවද පොත් 5,000-9,999 අතර ප්‍රමාණයක් දත්ත පදනමට ඇතුළත් කර ඇති පුස්තකාලවල ප්‍රතිශතය 30.8% කි. ඊට අමතරව පොත් 1,000-4,999 ඇතුළත් කර ඇති පුස්තකාල 10.9% ක් පවතින අතර 1,000 ට අඩු සංඛ්‍යාවකින් යුතු පොත් ප්‍රමාණයක් දත්ත පදනමට ඇතුළත් කර ඇති පුස්තකාල සංඛ්‍යාව 2.6% ක් බව අනාවරණය වේ.

මෙම මහජන පුස්තකාලවල පාඨකයන්ගේ අවශ්‍යතාවය අනුව විවිධ පුවත්පත් ප්‍රතිග්‍රහණය කොට පුවත්පත් එකතු පවත්වාගෙන ගිය ද කිසිදු පුස්තකාලයක් පුවත්පත්, දත්ත පදනමට ඇතුළත් කර නොමැති බව අනාවරණය වේ. ඊට අමතරව විවිධ වාර සඟරා ද මෙම පුස්තකාලවල පවතින අතර ප්‍රතිචාර දක්වන ලද මුළු පුස්තකාල අතරින් පුස්තකාල 16% ක ප්‍රතිශතයක් වාරසඟරා 1,000 ට අඩුවෙන් දත්ත පදනමට ඇතුළත් කර ඇති බව අනාවරණය වේ. මෙම පුස්තකාල සතුව ශ්‍රව්‍ය දෘශ්‍ය එකතු ද පවත්වාගෙන යනු ලබන අතර ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍ර 1,000 ට අඩු ප්‍රමාණයක් දත්ත පදනමට ඇතුළත් කර ඇති පුස්තකාලවල ප්‍රතිශතය 20% ක් බව අනාවරණය වේ.

## 4.2. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා ප්‍රමාණය (Total Cataloguing Records)

මෙම පුස්තකාලවල පවත්වාගෙන යන දත්ත පදනම්වලට ඇතුළත් කර ඇති ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා සංඛ්‍යාව (Total Cataloguing Records) පිළිබඳව සහ ඇතුළත් කර ඇති සාමාජික තොරතුරු සංඛ්‍යාව (Patron) පිළිබඳව ද මෙම සමීක්ෂණය මඟින් විමසා බලන ලදී.





| | 5000 අඩු | 5000-9999 | 10000 - 14999 | 15000 - 19999 | 20000 - 24999 | 25000 - 29999 | 30000 - 34999 | 35000 - 39999 | 40000 - 44999 | 45000 - 49999 | 50000 වැඩි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල සංඛ්‍යාව | 7.1 | 17.3 | 23.1 | 15.4 | 14.6 | 8.3 | 5.1 | 2.6 | 2.6 | 2.6 | 1.3 |

රූප සටහන අංක 12 : දත්ත පදනම් වෙත ඇතුළත් කර ඇති ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා සංඛ්‍යාව
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම පුස්තකාලවල දත්ත පදනම්වලට ඇතුළත් කරන ලද ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා සංඛ්‍යාව පිළිබඳ ලබා ගත් සමීක්ෂණ දත්ත අනුව, වැඩිම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා සංඛ්‍යාවක් එනම්, 10,000-14,999 වාර්තා ප්‍රමාණයක් ඇතුළත් කර ඇති පුස්තකාල සංඛ්‍යාව සමස්ත ප්‍රතිචාර අතරින් 23.1% ක් බව ඉහත රූප සටහන අනුව පැහැදිලි වේ. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු වාර්තා 5,000-9,999 අතර සංඛ්‍යාවක් දත්ත පදනමට ඇතුළත් කර ඇති පුස්තකාලවල ප්‍රතිශතය 17.3% කි. ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා 30,000 සිට 50,000 අතර සහ 50,000 ට වැඩියෙන් ඇතුළත් කර ඇති පුස්තකාල අවම ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා ප්‍රමාණයක් ඇතුළත් කර ඇති බව ඉහත රූප සටහන අනුව පැහැදිලි වේ.

### 4.3. සාමාජික තොරතුරු සංඛ්‍යාව (Patrons)

ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම මහජන පුස්තකාලවල පවත්වාගෙන යනු ලබන දත්ත පදනම්වලට ඇතුළත් කර ඇති සාමාජික තොරතුරු (Patrons) ප්‍රමාණය පිළිබඳව ද මෙම අධ්‍යයනය ඔස්සේ විමසා බලන ලදී.




| | 500 අඩු | 500-999 | 1000 - 1499 | 1500 - 1999 | 2000 - 2499 | 2500 - 2999 | 3000 - 3499 | 3500 - 3999 | 4000 - 4499 | 4500 - 4999 | 5000 වැඩි | ප්‍රතිචාර දක්වා නොමැති |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල සංඛ්‍යාව | 18.6 | 16.7 | 14.1 | 9.6 | 5.8 | 3.2 | 5.8 | 1.3 | 1.3 | 1.3 | 5.8 | 16.6 |


රූප සටහන අංක 13 : දත්ත පදනම්වලට ඇතුළත් කර ඇති සාමාජික තොරතුරු ප්‍රමාණය
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන් අංක 13 මඟින් පෙන්වාදී ඇති පරිදි, සාමාජික තොරතුරු 500 ට අඩු සංඛ්‍යාවක් දත්ත පදනමට ඇතුළත් කර ඇති පුස්තකාල ඉහළ අගයක් ගන්නා අතර එම පුස්තකාලවල ප්‍රතිශතය 18.6% කි. දෙවනුව වැඩිම සාමාජික තොරතුරු ප්‍රමාණයක් ඇතුළත් කර ඇති කාණ්ඩය වන්නේ 500-999 කාණ්ඩය වන අතර එම පුස්තකාලවල ප්‍රතිශතය 16.7% කි. 3,500 සිට 5,000 අතර කාණ්ඩයේ පුස්තකාල සාමාජික තොරතුරු අවම වශයෙන් ඇතුළත් කර ඇත.

### 4.4. කොහා (KOHA) මෘදුකාංගයෙහි භාවිත කරනු ලබන මොඩියුල් (Module) වර්ග

ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රියාවලියේදී පුස්තකාල බහුතරයක් කොහා මෘදුකාංගය යොදාගෙන තිබෙන බව අනාවරණය වේ. පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා කොහා මෘදුකාංගය භාවිත කිරීමේදී සාමාජිකත්වය (Patron), සූචිය (Catalogue), ග්‍රන්ථ සංසරණය (Circulation), ප්‍රතිග්‍රහණ කටයුතු (Acquisition), තොරතුරු ගවේෂණය (Search OPAC) සහ වාර්තා ලබා ගැනීම (Reports) යනාදි විවිධ මොඩියුල් භාවිතයට ගනු ලබයි.

මෙම සමීක්ෂණය ඔස්සේ ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කරන ලද මහජන පුස්තකාල ආශ්‍රිතව ඉහත සඳහන් කරන ලද මොඩියුල් භාවිතයට ගන්නා ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන ලදි.





රූප සටහන අංක 14 : කොහා මෘදුකාංගය ආශ්‍රිතව භාවිත කරන මොඩියුල් වර්ග (Modules)
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2025

ඉහත රූප සටහන් අංක 14 ට අනුව ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල අතරින් මහජන පුස්තකාල 68% (106) ක් පමණ, සාමාජිකත්වය, සූචිය, ග්‍රන්ථ සංසරණය, ප්‍රතිග්‍රහණ කටයුතු, තොරතුරු ගවේෂණය සහ වාර්තා ලබා ගැනීම ආදී කොහා මෘදුකාංගය සතු සියලුම මොඩියුල් භාවිත කරනු ලබන බව අනාවරණය වේ.

ඊට අමතරව, මෙම සියලුම මොඩියුල් භාවිත නොකරනු ලබන එහෙත් එක් එක් මොඩියුල පමණක් භාවිත කරනු ලබන පුස්තකාල සීමිත ප්‍රමාණයක් තිබෙන බව ද අනාවරණය විය. ඒ අනුව සාමාජිකත්ව මොඩියුලය පමණක් භාවිත කරනු ලබන පුස්තකාල සංඛ්‍යාව 2.6% (4) ක් වන අතර සූචිය පමණක් භාවිත කරන පුස්තකාල ප්‍රමාණය 4.5% (7) ක් වේ. කොහා මෘදුකාංගය යටතේ ග්‍රන්ථ සංසරණ කටයුතු සිදු කිරීමේ මොඩියුලය පමණක් භාවිත කරන පුස්තකාල ප්‍රමාණය 2% (3) කි. මීට අමතරව ප්‍රතිග්‍රහණ කටයුතුවලට අදාළ මොඩියුලය භාවිත කරන පුස්තකාල ප්‍රමාණය 0.6% (1) කි.

### 4.5. ස්වයංක්‍රීයකරණය හා ඒ සම්බන්ධ මොඩියුල (Modules) පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම

පුස්තකාලයක් ස්වයංක්‍රීයකරණය කිරීමේදී භෞතික වශයෙන් පුස්තකාලයෙහි සම්පත් හා සේවාවල වර්ධනයක් සිදු වේ. එමෙන්ම ස්වයංක්‍රීයකරණය ඔස්සේ ඒ ආශ්‍රිත මොඩියුල එනම් සාමාජිකත්වය (Patron), සූචිය (Catalogue), ග්‍රන්ථ සංසරණය (Circulation), ප්‍රතිග්‍රහණ කටයුතු (Acquisition), තොරතුරු ගවේෂණය (Searching OPAC) සහ වාර්තා ලබා ගැනීම (Reports) ආදී මොඩියුල පිළිබඳව පුස්තකාල භාවිත කරනු ලබන පාඨකයින් දැනුවත් කිරීම් කටයුතු පුස්තකාලය මගින් සිදු කිරීම වැදගත් වන අතර එමගින් පාඨකයින්ට ඒ පිළිබඳ අවබෝධයක් ලැබෙන අතර එම සේවා ලබා ගැනීමට පිවිසීම සඳහා පෙළඹවීමක් ද ඇති වේ. මෙම පුස්තකාල විසින් සිදු කරන එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳව ද මෙම සමීක්ෂණයේදී අවධානය යොමු කරන ලදි.




රූප සටහන අංක 15 : ස්වයංක්‍රීයකරණය හා ඒ සම්බන්ධ මොඩියුල පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීම

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත රූප සටහන අංක 15 අනුව ස්වයංක්‍රීයකරණ කටයුතු සිදු කර තිබෙන මෙම පුස්තකාල මගින් ස්වයංක්‍රීයකරණය කර ඇති එම පුස්තකාල පරිහරණය කිරීම හා ඒ සඳහා භාවිත කර ඇති විවිධ මොඩියුල පිළිබඳව පාඨකයන් දැනුවත් කිරීම බොහෝ පුස්තකාල මගින් සිදු කර ඇති අතර එම පුස්තකාලවල ප්‍රතිශතය 63% ක් වේ. එමෙන්ම මෙම මොඩියුල පිළිබඳව පාඨකයන්ව දැනුවත් කිරීම් සිදු කර නොමැති පුස්තකාලවල ප්‍රතිශතය 17% කි. ඒ අනුව, මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණය කර තිබීම හා ඒ සම්බන්ධ මොඩියුල පිළිබඳව බහුතර පාඨක ප්‍රජාවක් දැනුවත් කිරිමට මෙම පුස්තකාල මගින් කටයුතු කර ඇති බැවින් එම පාඨකයින්ට එම පුස්තකාල පහසුකම් මගින් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම සඳහා අවබෝධයක් සහ පෙළඹවීමක් සිදු කර ඇති බව අනාවරණය වේ.

### 4.6. ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති මඟින් පුස්තකාලවල වැඩි දියුණු කරන ලද පහසුකම්/සේවා

විවිධ බාහිර ආයතන මඟින් සහ ස්වකීය පුස්තකාල මඟින් සිදු කරන ලද මෙම ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති මඟින් බලාපොරොත්තු වන මූලිකම අරමුණ වන්නේ එම පුස්තකාලවල පවතින පහසුකම් හා සේවා පාඨකයන් වෙත කාර්යක්ෂමව ලබා ගැනීමට අවස්ථාව ලබා දීම හා පුළුල් කිරීමයි. ඒ අනුව මෙම සමීක්ෂණය ඔස්සේ ස්වයංක්‍රීයකරණය කිරීම හේතුවෙන් එම පුස්තකාල ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන පහසුකම් හා සේවා දියුණු වී තිබේ ද යන්න විමසා බලන ලදී. මේ සම්බන්ධයෙන් පුස්තකාල භාර නිලධාරීන්ගෙන් ලැබී ඇති ප්‍රතිචාර අනුව පෙනී යන්නේ මෙම පුස්තකාල ආශ්‍රිත ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති හේතුවෙන් එම පුස්තකාලවල පහසුකම් සහ සේවාවන් තවදුරටත් වැඩි දියුණු වූ බවයි.

අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම, ඡායා පිටපත් සේවාව, ලේඛන ස්කෑන් කිරීමේ සේවාව, Geo Maps පහසුකම්, Wifi පහසුකම්, විශාල දත්ත ප්‍රමාණයක් නිවැරදිව හා පහසුවෙන් හැසිරවීමට හැකි වීම, කාර්යක්ෂමව හා පහසුවෙන් තොරතුරු ගවේෂණ හැකියාව වර්ධනය වීම, කාර්යයන් ද්විත්වකරණය වැළැක්වීම, පුස්තකාල සේවා ඉහළ ගුණාත්මකභාවයකින් සැපයීමට හැකි වීම සහ ස්වයංක්‍රීයකරණය පිළිබඳ පාඨක අධ්‍යාපනය වැඩි දියුණු වීම ආදී ක්ෂේත්‍ර ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය මඟින් පුස්තකාල ආශ්‍රිතව වැඩි දියුණු වූ පහසුකම් හා සේවා ලෙස හඳුනා ගත හැකිය.

වගු අංක 10 : ස්වයංක්‍රීයකරණය කරන ලද ව්‍යාපෘති මඟින් පුස්තකාල ආශ්‍රිතව වැඩි දියුණු වූ පහසුකම් /සේවා

| වැඩි දියුණු වූ පහසුකම් හා සේවා | ඉතා හොඳයි | තරමක් දුරට | සාමාන්‍යය | කිසිසේත්ම නැත | ප්‍රතිචාර දක්වා නොමැති |
|---|---|---|---|---|---|
| අන්තර්ජාල පහසුකම් | 84 (53.8%) | 33 (21.2%) | 24 (15.4%) | 15 (9.6%) | - |
| ඡායා පිටපත් සේවාව | 57 (36.5%) | 37 (25.0%) | 33 (21.2%) | 27 (17.3%) | - |
| ලේඛන ස්කෑන් කිරීමේ පහසුකම් | 33 (21.2%) | 19 (12.2%) | 19 (12.2%) | 37 (23.7%) | 48 (30.8%) |
| GEO Maps පහසුකම් | 10 (6.4%) | 12 (7.7%) | 16 (10.3%) | 50 (32.1%) | 68 (43.6%) |
| Wi-Fi පහසුකම් | 57 (36.5%) | 33 (21.2%) | 16 (10.3%) | 8 (5.1%) | 42 (26.9%) |
| විශාල දත්ත ප්‍රමාණයක් නිවැරදිව හා පහසුවෙන් කළමනාකරණය | 66 (42.5%) | 31 (19.9%) | 20 (12.8%) | 7 (4.5%) | 32 (20.5%) |
| කාර්යක්ෂම හා පහසු තොරතුරු ගවේෂණ හැකියාව | 78 (50%) | 24 (15.4%) | 20 (12.8%) | 7 (4.5%) | 27 (17.3%) |
| කාර්යයන් ද්විත්වකරණය වැළැකීම | 56 (35.9%) | 23 (14.8%) | 19 (12.2%) | 14 (9%) | 44 (28.2%) |
| පුස්තකාලයේ සේවා ඉහළ ගුණාත්මකභාවයෙන් සැපයීමට හැකිවීම | 80 (51.5%) | 28 (17.9%) | 12 (7.7%) | 4 (2.6%) | 32 (20.5%) |
| තෘප්තිමත් පාඨක සේවාවක් සැපයීමට හැකිවීම | 82 (52.6%) | 27 (17.3%) | 11 (7.1%) | 4 (2.6%) | 32 (20.5%) |
| ස්වයංක්‍රීයකරණය පිළිබඳ පාඨක අධ්‍යාපනය | 39 (2%5) | 43 (27.6%) | 28 (17.3%) | 9 (5.8%) | 38 (24.4%) |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත වගු අංක 10 ට අනුව ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘති/වැඩසටහන් ඔස්සේ පුස්තකාලය තුළ වැඩි දියුණු වූ පහසුකම් හා සේවා අතරින් ප්‍රමුඛතාවයක් හිමි වන්නේ අන්තර්ජාල පහසුකම් වැඩි දියුණු වීම කෙරෙහිය. සමස්ත පුස්තකාල අතරින් 54% කට ආසන්න පුස්තකාල ප්‍රමාණයක අන්තර්ජාල පහසුකම් වැඩි දියුණු වූ බව අනාවරණය වේ. එමෙන්ම, ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසු පාඨක ප්‍රජාව වෙත වඩා තෘප්තිමත් ක්‍රමවත් සහ කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකියාව ලැබී ඇති බවට පුස්තකාල 52.6%ක් ප්‍රතිචාර දක්වා ඇත. පුස්තකාලය භාවිත කරනු ලබන පාඨක ප්‍රජාව වෙත කාර්යක්ෂමව හා පහසුවෙන් තොරතුරු ගවේෂණය කිරීමට හැකියාව ඇති කිරීමට හැකි වූ බවට පුස්තකාල (50%) ප්‍රතිචාර දක්වා ඇත. විශාල දත්ත ප්‍රමාණයක් නිවැරදිව හා පහසුවෙන් කළමනාකරණය කිරීමට හැකි වීම පිළිබඳව පුස්තකාල 66 (42.5%) ක් පමණ ප්‍රතිචාර දක්වා ඇත. ඡායා පිටපත් සේවාව වැඩි දියුණු වීම (36.5%), Wi-Fi පහසුකම් වැඩි දියුණු වීම (36.5%) සහ කාර්යයන් ද්විත්වකරණය වැළකීම (36%) ආදී වශයෙන් ප්‍රතිචාර ලැබී ඇත. මීට අමතරව ස්වයංක්‍රීයකරණය පිළිබඳ පාඨක අධ්‍යාපනය ලබා දීම (25%) සහ ලේඛන ස්කෑන් කිරීමේ (Scanning) පහසුකම් වර්ධනය වීම (21.2%) ද මෙම පුස්තකාල ස්වයංක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘති ඔස්සේ සිදු වූ බව දත්ත විශ්ලේෂණය කිරීම තුළින් අනාවරණය වේ. මීට අමතරව Geo-Maps පහසුකම් ලබා දී ඇති පුස්තකාල ප්‍රමාණය අවම අගයක් වෙන අතර එය 6.4%කි. උක්ත සමීක්ෂණ දත්ත අනුව, ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවල පහසුකම් හා සේවා ඉතා සැලකිය යුතු අන්දමින් වැඩි දියුණු වී ඇති බව අනාවරණය වේ.

## 4.7. මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය

### 4.7.1. ස්වයංක්‍රීයකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයාම සහ එම කටයුතු අක්‍රියවීමට බලපා ඇති හේතු සාධක

ඉහත සාකච්ඡා කර ඇති පරිදි, මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා විවිධ ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. එම ව්‍යාපෘති යටතේ ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවල අදාළ කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා තවදුරටත් එම ව්‍යාපෘති හරහා ලබාදෙන සහයෝගය, පසු විපරම් සිදු කිරීම හා නඩත්තු කටයුතු සිදුවන ආකාරය පිළිබඳව මෙම අධ්‍යයනය මඟින් විමසා බලන ලදි. ලැබී ඇති දත්ත අනුව, විවිධ හේතු මත බොහෝ පුස්තකාලවල මෙම ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක නොවන බව අනාවරණය විය. ස්වයංක්‍රීයකරණ කටයුතු සිදුකරමින් පවතින අතරතුර සර්වර් පහසුකම් අක්‍රියවීම, පරිගණක පද්ධතිය අක්‍රියවීම, කොහා මෘදුකාංගය ස්ථාපනය (Upgrading) පිළිබඳ ගැටලු, පරිගණක නඩත්තු කටයුතු පිළිබඳ ගැටලු සහ පුස්තකාලවලට මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීම අවම වීම යන හේතු මෙම ව්‍යාපෘති අඩාලවීමට බලපා ඇති බව අනාවරණය වේ.

වගු අංක 11 : පරිගණකගත කිරීමේ ව්‍යාපෘති දැනට අක්‍රියවීමට බලපා ඇති හේතු සාධක

| ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති අඩාල වීමට බලපා ඇති හේතු | පුස්තකාල සංඛ්‍යාව |
|---|---|
| සර්වර් පහසුකම් අක්‍රියවීම | 12 (7.7%) |
| පරිගණක පද්ධතිය අක්‍රියවීම | 2 (1.2%) |
| මෘදුකාංගය ස්ථාපනය පිළිබඳ ගැටලු | 3 (1.9%) |
| පරිගණක නඩත්තු කටයුතු පිළිබඳ ගැටලු | 2 (1.3%) |
| මූල්‍යමය ප්‍රතිපාදන අවමවීම | 3 (1.9%) |
| ප්‍රතිචාර දක්වා නොමැති | 134 (86%) |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත වගු අංක 11 ට අනුව පැහැදිලි වන්නේ බහුතර පුස්තකාල ප්‍රමාණයක්, එනම් 7.7% සර්වර් පහසුකම් අක්‍රීයවීම හේතුවෙන් එම පුස්තකාලවල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය අතරමඟ නවත්වා ඇති බවයි. එමෙන්ම පිළිවෙලින් පරිගණක මෘදුකාංග ස්ථාපනය කිරීමේ ගැටලු (1.9%), මූල්‍ය ප්‍රතිපාදන අවම වීම (1.9%), පරිගණක නඩත්තු කටයුතුවල ගැටලු (1.3%) සහ පරිගණක පද්ධති බිඳවැටීම් (1.2%) මත මෙම පුස්තකාලවල ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘති දැනට පවත්වාගෙන නොයන බව අනාවරණය වේ.

## 4.8. ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල වර්තමානයේදී මුහුණපා ඇති ගැටලු හා අභියෝග

ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මකවීමේදී මෙම පුස්තකාල වර්තමානයේ දී මුහුණදෙනු ලබන ගැටලු හා අභියෝග සම්බන්ධයෙන් මෙම සමීක්ෂණය මඟින් අවධානය යොමු කරන ලදී. මෙම පුස්තකාලවල වත්මන් තත්වය, අභියෝග හා ගැටලු පිළිබඳව පහත සඳහන් ප්‍රතිචාර ලැබී ඇත.

වගු අංක 12 : ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල මුහුණදෙනු ලබන ගැටලු/අභියෝග

| ගැටලු හා අභියෝග | උග්‍ර ගැටලුවකි | සාමාන්‍ය තත්වයකි | අදාළ නැත | ප්‍රතිචාර දක්වා නොමැති |
|---|---|---|---|---|
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ලබාදෙන සේවා/පුහුණු ප්‍රමාණවත් නොවීම | 19 (12.2%) | 73 (46.8%) | 25 (16%) | 39 (25%) |
| පුහුණුවලත් නිලධාරීන් ඉවත්ව යාම | 58 (37.2%) | 24 (15.4%) | 31 (19.9%) | 43 (24.5%) |
| නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම | 32 (20.5%) | 55 (35.3%) | 29 (18.6%) | 40 (25.6%) |
| මූල්‍යමය ගැටලු | 37 (23.7%) | 54 (34.6%) | 25 (16%) | 40 (25.6%) |
| සර්වර්ස් (Servers) සම්බන්ධ ගැටලු | 46 (29.5%) | 49 (31.4%) | 22 (14.1%) | 39 (25%) |
| ජාලකරණය සම්බන්ධ ගැටලු (Networking) | 32 (20.5%) | 60 (38.5%) | 21 (13.5%) | 43 (27.6%) |
| අන්තර්ජාල පහසුකම් බිඳවැටීම් | 30 (19.2%) | 60 (38.5%) | 28 (17.9%) | 37 (23.7%) |
| අදාළ පළාත් පාලන ආයතනයෙන් සහාය නොලැබීම | 10 (6.4%) | 45 (28.8%) | 55 (35.3%) | 46 (29.5%) |
| උපකරණ හා මෙවලම් හිඟතාවය | 26 (16.7%) | 56 (35.9%) | 33 (21.2%) | 41 (26.3%) |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, 2025

ඉහත වගු අංක 12 ට අනුව, ස්වයංක්‍රීයකරණ කටයුතු සම්බන්ධයෙන් පුහුණුව ලබා ගත් නිලධාරීන් එම පුස්තකාලවල සේවයෙන් ඉවත්ව යාම හෝ වෙනත් පුස්තකාල වෙත ස්ථාන මාරුවීම් සිදුකිරීම හේතුවෙන් ස්වයංක්‍රීයකරණ සේවා සැපයීම හා ස්වයංක්‍රීයකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම ප්‍රධාන අභියෝගයක් බවට පත්වී ඇති බව පැහැදිලි වේ. සමස්ත පුස්තකාල අතරින් පුස්තකාල 37.2% (58) ක් මෙම ගැටලුවට මුහුණපා ඇත. එමෙන්ම ස්වයංක්‍රීයකරණය කරන ලද මෙම පුස්තකාලවල තවත් උග්‍ර ගැටලුවක් ලෙස, සර්වර් (Server) පහසුකම් ප්‍රමාණවත් නොවීම හඳුනා ගත හැකිය. එම ගැටලුව පුස්තකාල 46 (29.5%) ක පමණ උග්‍රව පවතින බව අනාවරණය වේ. ස්වයංක්‍රීයකරණ කටයුතු පවත්වාගෙන යාමේදී එම පුස්තකාලවලට මූල්‍යමය ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටලු පැවතීම (23.7%), ස්වයංක්‍රීයකරණ කටයුතුවලට අදාළ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම (20.5%), ජාලකරණය (Networking) සම්බන්ධ ගැටලු (20.5%), අන්තර්ජාල පහසුකම් බිඳ වැටීම් (19.2%) සහ මෙම ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවල පවතින උපකරණ හා මෙවලම් හිඟතාවය ද (16.7%) මෙම පුස්තකාල මුහුණ දෙනු ලබන ප්‍රමුඛතම ගැටලු ලෙස හඳුනා ගත හැකිය.

එමෙන්ම, පුස්තකාලවල කටයුතු සම්බන්ධයෙන් මූලිකත්වය සහ උපදෙස් ලබා දෙනු ලබන ජාතික ආයතනය වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් මෙම ස්වයංක්‍රීයකරණ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සේවා/පුහුණුවීම් ලබාදීම හා නියාමනය සිදුකිරීම ප්‍රමාණවත් නොවීම ද තවත් ප්‍රමුඛ ගැටලුවක් බව සමීක්ෂණ දත්ත අනුව අනාවරණය වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ස්වයංක්‍රීයකරණ කටයුතුවලට අදාළ සේවා/පුහුණුවීම් හා නියාමනයන් සිදු කිරීම අපේක්ෂිත පුස්තකාලවල ප්‍රතිශතය (12.2%) කි.

ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මක වීමේදී මෙම පුස්තකාල මුහුණදෙන ඉහත සඳහන් කළ ගැටලු හා අභියෝගවලට අමතරව තවත් පොදු ප්‍රායෝගික ගැටලු රාශියක් පවතින බව මෙම සමීක්ෂණය මගින් අනාවරණය විය.

කොහා දත්ත පද්ධතිය ආශ්‍රිතව පැන නගින ප්‍රායෝගික ගැටලු ඒ අතරින් ප්‍රධානතම ගැටලුවක් බව අනාවරණය වේ. කොහා දත්ත පද්ධතියෙහි නව අනුවාද (New versions) ලබා ගැනීමේදී පවතින දුෂ්කරතාවය සහ පද්ධතිය තුළ ඇති වන ගැටලු හඳුනා ගැනීම සහ ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට නිශ්චිත ආයතනයක් නොමැති වීම මෙම පුස්තකාලවල පවතින ප්‍රධාන ගැටලුවකි. එමෙන්ම කොහා දත්ත පද්ධතිය තුළ ඇතුළත් කර ඇති ග්‍රන්ථ කේතනය (Barcode) කිරීමේදී ගැටලු සහගත තත්වයන් මතුවීම, කොහා පද්ධතිය හරහා පාඨකයන් සමඟ සන්නිවේදනය කිරීමට හැකියාවක් නොමැතිවීම සහ කොහා දත්ත පද්ධතිය නඩත්තු කිරීමට වාර්ෂිකව විශාල මුදලක් වැය කිරීමට සිදුවීම, කොහා දත්ත පද්ධතියෙහි නව එළැඹුම් (New approaches) පිළිබඳව පුස්තකාල කාර්යය මණ්ඩලය වෙත අදාළ දැනුවත් කිරීම් සිදු කිරීම සහ දැනුම යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් ඇති දුෂ්කරතා වැනි ගැටලු රැසකට මෙම පුස්තකාල මුහුණපා ඇත. තවද ස්වයංක්‍රීයකරණ කාර්යයන් පවත්වාගෙන යාමේදී ඇති වන තාක්ෂණික දෝෂ, පරිගණක දෘඩාංග (Hardware) සපයා ගැනීම සහ හදිසියේ ඇතිවන විවිධ තාක්ෂණික ගැටලු ක්ෂණිකව නිරාකරණය කර ගැනීමට නොහැකි වීම සහ Wifi සහ අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමේ දී ඒ ඒ පළාත් පාලන ආයතන එම පහසුකම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමා වීම වැනි ගැටලු මත මෙම පුස්තකාලවල ක්‍රියාත්මක ස්වයංක්‍රීයකරණ සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ගැටලුකාරී තත්වයන් පවතින බව මෙම සමීක්ෂණය මගින් අනාවරණය වේ.

එමෙන්ම, පරිගණකගත කර ඇති දත්තවල ආරක්ෂාව සඳහා නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම හා ඒ සඳහා අවශ්‍ය දැනුම සහ උපාංග නොමැතිවීම උග්‍ර ගැටලුවක් බව අනාවරණය වේ. එමෙන්ම බොහෝ පුස්තකාල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති වීම සහ පවතින ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, ළමා සාමාජිකයන් වෙත පොත් නිකුත් කිරීමේදී ගැටලු ඇති වීම, මූල්‍යමය ප්‍රතිපාදන අවශ්‍ය වේලාවට සපයා ගැනීමේ අපහසුතා, තාක්ෂණික ගැටලුවලදී අවශ්‍ය සහය ලබා ගත නොහැකි වීම, දත්ත පදනම පිළිබඳව පාඨකයන් තුළ පවතින දැනුවත්භාවය අවම වීම සහ සේවා ලබා ගැනීම කෙරෙහි දක්වන උනන්දුව අවම වීම හා ආකල්පමය ගැටලු පැවතීම වැනි ප්‍රායෝගික දුෂ්කරතා රැසකට ද මෙම පුස්තකාල මුහුණපා සිටින බව මෙම සමීක්ෂණය මගින් අනාවරණය විය.

## පස්වන පරිච්ඡේදය

## 05. පර්යේෂණයේ සොයාගැනීම්, නිර්දේශ සහ නිගමන

### 5.1. අනාවරණය වන ප්‍රධාන කරුණු සහ සොයාගැනීම්

#### 1. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ වර්තමාන තත්ත්වය සහ ව්‍යාප්තිය

- සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන ලද මහජන පුස්තකාල 635 න් පුස්තකාල 156ක් (24.6%) පමණක් ස්වයංක්‍රීයකරණය කර ඇති බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය විය. ජාතික මට්ටමින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ ප්‍රවේශය තවමත් ආරම්භක අවධියේ පවතින බව මෙමඟින් ගම්‍ය වේ.

- ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (58.3%) ප්‍රාදේශීය සභා යටතේ පවතින අතර, ප්‍රතිපත්ති සම්පාදනයේ දී මෙම පුස්තකාල වෙත විශේෂ අවධානයක් යොමු කිරීම මෙන්ම මහ නගර සභා සහ නගර සභාවලට අයත් වන මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම සාපේක්ෂව අවම මට්ටමක පවතින බවද අනාවරණය වේ.

- මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය 2017-2018 වසරවලදී සැලකිය යුතු ලෙස වේගවත් වී ඇති අතර, 2023 වසරේදී මහජන පුස්තකාල වැඩි සංඛ්‍යාවක් ස්වයංක්‍රීයකරණයට ලක් වී ඇත.

#### 2. භාවිත වන මෘදුකාංග සහ තාක්ෂණය

- KOHA විවෘත මූලාශ්‍ර මෘදුකාංගය ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල 84.6% ක් විසින් භාවිත කරන බව අනාවරණය වන අතර ශ්‍රී ලංකාවේ පුස්තකාලවල KOHA මෘදුකාංගයෙහි ප්‍රචලිතතාවය සහ එහි ප්‍රමිතිගත බව මෙමඟින් පෙන්නුම් කරයි.

- කඩියා, CAT 2020, ග්‍රන්ථලිබ්, පුර නැගුම, වයඹ පුස්තකාල සංවර්ධන වැඩසටහන වැනි ප්‍රාදේශීය මෘදුකාංග ද භාවිත වුවද, ඒවා සීමිත භාවිතයක් පවතී.

- ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවලින් 68% ක් KOHA මෘදුකාංගයෙහි සියලුම ප්‍රධාන මොඩියුල (සාමාජිකත්ව නිකුත් කිරීම, සූචිය, ග්‍රන්ථ සංසරණය, ප්‍රතිග්‍රහණය, OPAC) භාවිත කරන බවට වාර්තා වේ.

#### 3. ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති සහ සම්පත්

- ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සිදුකරන ලද ප්‍රධාන ව්‍යාපෘති ලෙස, ICTA ආයතනය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය (පුස්තකාල 25), UNDP සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් දියත් කළ ව්‍යාපෘතිය (පුස්තකාල 18) සහ පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදනවලින් විවිධ බාහිර ආයතනවල තාක්ෂණික උපදේශකත්වය මත සිදුකළ ව්‍යාපෘති ( පුස්තකාල 63) හඳුනා ගත හැකිය.

- විවිධ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති මගින් පුස්තකාලවලට ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප්, බාර්කෝඩ් රීඩර්ස් ප්‍රින්ටර්ස් සහ සර්වර් වැනි භෞතික සම්පත් සපයා දී ඇත.

- කෙසේ වෙතත්, සර්වර් පහසුකම් පුස්තකාල 41.7% ක ක්‍රියාත්මක නොවන බවත්, බාර්කෝඩ් රීඩර්ස් 32.1% ක් සහ ඡායාපිටපත් යන්ත්‍ර 67% ක් නොමැති බවත් හෙළි වී ඇත.

**4.** **ගැටලු සහ අභියෝග**

- **මානව සම්පත්:** පුහුණුවලත් කාර්යය මණ්ඩලය ස්ථාන මාරුවීම හෝ ඉවත්වීම (37.2%) උග්‍ර ගැටලුවක් ලෙස වාර්තා වේ. (මෙම තත්ත්වය ස්වයංක්‍රීයකරණ සේවාවල අඛණ්ඩතාවයට විශාල බාධාවක් බව හෙළි වී ඇත).

- **තාක්ෂණික අභියෝග:** සර්වර් ගැටලු (29.5%), ජාලකරණ ගැටලු (20.5%) සහ අන්තර්ජාල බිඳවැටීම් (19.2%) පවතින තාක්ෂණික අභියෝග ලෙස හඳුනාගෙන ඇත.

- **මූල්‍ය සහ නඩත්තු ගැටලු:** මූල්‍ය ගැටලු (23.7%) සහ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම (20.5%) දත්තවල ආරක්ෂාව සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම (Backups පවත්වාගෙන නොයෑම) ස්වයංක්‍රීයකරණ පද්ධතිවල තිරසාරත්වයට තර්ජනයක් බව පෙනේ.

- **ප්‍රමාණවත් පුහුණුවක් නොලැබීම :** ජාතික පුස්තකාල හා සේවා මණ්ඩලය විසින් සපයනු ලබන පුහුණුව ප්‍රමාණවත් නොවන බවට 46.8% ක් ප්‍රතිචාර දක්වා ඇති අතර , 12.2% ක් එය උග්‍ර ගැටලුවක් බවට ප්‍රතිචාර දක්වා ඇත.

**5.** **සේවා සහ බලපෑම**

- ස්වයංක්‍රීයකරණය හේතුවෙන් අන්තර්ජාල පහසුකම් (පුස්තකාල 53.8%), Wi-Fi පහසුකම් (පුස්තකාල 36.5%), සහ ඡායා පිටපත් සේවා (පුස්තකාල 36.5%) වැනි පහසුකම් වැඩි දියුණු වී ඇත.

- පාඨකයින්ට තෘප්තිමත් සේවාවක් ලබා දීමට හැකි වීම (52.6%), පුස්තකාලයේ සේවා ගුණාත්මකභාවය වැඩි වීම (51.5%), සහ කාර්යක්ෂම තොරතුරු ගවේෂණ හැකියාව (50%) වැඩි දියුණු වී ඇති බව පුස්තකාල බහුතරයක් ප්‍රතිචාර දක්වා ඇත.

**6.** **අනාගත අවශ්‍යතා**

- දත්ත පදනම් කළමනාකරණය කිරීම : ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල 52.6% ක දත්ත පදනම්වලට පොත් 10,000කට වැඩි සංඛ්‍යාවක් ඇතුළත් කර ඇත. මෙම විශාල දත්ත ප්‍රමාණය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හා එම දත්තවල ආරක්ෂාව එම පුස්තකාලවලට අභියෝගයක් වී ඇත.

- සාමාජික කළමනාකරණය : සාමාජික තොරතුරු 500 ට අඩු ප්‍රමාණයක් ඇතුළත් කර ඇති පුස්තකාල (18.6%) වැඩිම අගයක් ගන්නා බැවින් පාඨක සහභාගීත්වය වැඩි කිරීම සඳහා මෙම පුස්තකාල විසින් ඉලක්ක කළ යුතු බව පෙනේ.

ඉහත අනාවරණය වන කරුණු අනුව ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සම්බන්ධයෙන් විවිධ ව්‍යාපෘති හරහා සාර්ථක ආරම්භයක් ලබාගෙන ඇති බව පැහැදිලි වේ. විශේෂයෙන්ම KOHA මෘදුකාංගයේ ප්‍රචලිත භාවිතය සහ සේවා ගුණාත්මකභාවය තුළින් එම තත්වය වැඩි දියුණු වී ඇත. එමෙන්ම මානව සම්පත්, තාක්ෂණික යටිතල පහසුකම්, නඩත්තු කටයුතු සහ මූල්‍ය ප්‍රතිපාදනවල අඛණ්ඩත්වය පිළිබඳ බාධක හේතුවෙන් මෙම ව්‍යාපෘතිවල තිරසාරත්වය සහ ව්‍යාප්තිය සීමා වී ඇති බව අනාවරණය වේ. මෙම සොයාගැනීම් මඟින් අනාගතයේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවලදී මානව හා තාක්ෂණික සම්පත් කළමනාකරණයට, ශක්තිමත් අඛණ්ඩ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ පද්ධතිවල තිරසාරත්වය සහතික කිරීම සඳහා අඛණ්ඩ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම සහ නියාමනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ගම්‍ය වේ.

## 5.2 නිර්දේශ

මෙම පර්යේෂණයේ සොයාගැනීම් මත පදනම්ව, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය තවදුරටත් සාර්ථක කරගැනීම සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

**1. මූල්‍ය සහ භෞතික සම්පත්**

- **නිත්‍ය මූල්‍ය ප්‍රතිපාදන:** පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධතිවල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා රජයේ සහ පළාත් පාලන ආයතනවල අයවැයෙන් නිශ්චිත සහ ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම අත්‍යාවශ්‍ය වේ.
- **ප්‍රාදේශීය සහාය:** පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ව්‍යාපාර, සහ ප්‍රජා සංවිධාන සමඟ සහයෝගීතාවයක් ගොඩනඟා ගෙන ප්‍රාදේශීය මට්ටමින් මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා ගැනීමට පුස්තකාල උත්සාහ දැරිය යුතුය.
- **උපකරණ නඩත්තු අරමුදල:** පරිගණක, සර්වර්, මුද්‍රණ යන්ත්‍ර සහ ජාල උපාංග වැනි උපකරණ නිත්‍යව නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා විශේෂ අරමුදලක් සකස් කළ යුතුය.
- **දත්තවල ආරක්ෂාව සඳහා අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම:** පරිගණකගත කර ඇති දත්තවල ආරක්ෂාව සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා කටයුතු කිරීම (Backups තබා ගැනීම).

**2. මානව සම්පත් සහ පුහුණුව**

- **අඛණ්ඩ පුහුණු වැඩසටහන්:** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් KOHA මෘදුකාංගය, දත්ත පාලනය, මූලික ජාලකරණය සහ ගැටලු නිරාකරණය පිළිබඳ අඛණ්ඩ පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතුය.
- **තාක්ෂණික නිලධාරීන් පත් කිරීම:** විශේෂයෙන්ම විශාල පුස්තකාල සඳහා පද්ධති නඩත්තුව සහ තාක්ෂණික සහාය සැපයීම සඳහා තාක්ෂණික නිලධාරීන් පත් කිරීම සලකා බැලිය යුතුය.
- **දැනුම හුවමාරු කිරීමේ ක්‍රමවේද:** පුහුණුවලත් කාර්ය මණ්ඩලය ස්ථාන මාරුවීම් හෝ විශ්‍රාම යාම නිසා පුස්තකාල අතර දැනුම ගිලිහීයාම වැළැක්වීම සඳහා දැනුම ලේඛනගත කිරීම සහ හුවමාරු කිරීමේ ක්‍රමවේද (Knowledge Management System) හඳුන්වා දිය යුතුය.

**3. තාක්ෂණික යටිතල පහසුකම්**

- **විශ්වසනීය අන්තර්ජාල සේවා:** සියලුම ස්වයංක්‍රීයකරණය කළ පුස්තකාලවලට වේගවත් සහ විශ්වසනීය අන්තර්ජාල සම්බන්ධතාවක් ලබා දීම සහතික කිරීම.
- **Cloud-based සේවාවන්ට මාරු වීම:** භෞතික සර්වර් නඩත්තුවේ ගැටලු අඩු කිරීම සඳහා, වලාකුළු-ආධාරිත (Cloud-based) සේවාවන් කෙරෙහි ප්‍රමුඛතාවය දිය යුතුය. මෙමඟින් දත්ත ආරක්ෂිතවීම (Backups) සහ දුරස්ථ ප්‍රවේශය ද පහසු වේ.

- **කේන්ද්‍රීය තාක්ෂණික සහාය ඒකකය:** පුස්තකාලවලට ජාලකරණ, මෘදුකාංග සහ දෘඩාංග ගැටලු සඳහා වේගවත්ව සහාය ලබා දිය හැකි කේන්ද්‍රීය තාක්ෂණික සහාය ඒකකයක් ස්ථාපිත කිරීම (Central Technical Supporting Unit).

**4. ප්‍රතිපත්ති සහ සහයෝගීතාව**

- **ජාතික මට්ටමින් මාර්ගෝපදේශනය:** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සියලුම පළාත් පාලන ආයතන සඳහා සම්මත කරන ලද ස්වයංක්‍රීයකරණ මාර්ගෝපදේශන සහ ප්‍රමිති සකස් කළ යුතුය.

- **පුස්තකාල ජාලය ශක්තිමත් කිරීම :** PubNet (Public Library Network) වැනි පුස්තකාල ජාල ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම, සම්පත් හුවමාරු කිරීම, අත්දැකීම් බෙදාගැනීම සහ ඒකාබද්ධ සුචි පවත්වාගෙන යාමට ඉවහල් වේ.

- **සියලුම පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය:** ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් පාලන අමාත්‍යාංශය, ICTA, විවෘත විශ්වවිද්‍යාලය සහ ප්‍රාදේශීය ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

**5. පාඨක සේවා සහ අධ්‍යාපනය**

- **ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන්:** පාඨකයින්ට මාර්ගගත පොදු ප්‍රවේශ සුචිය (OPAC) භාවිත කිරීම, ඩිජිටල් සම්පත් සෙවීම සහ මාර්ගගත සේවා වලින් ප්‍රයෝජන ගැනීමට උපකාර කිරීම සඳහා පුස්තකාල මඟින් ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කළ යුතුය.

- **පාඨක දැනුවත්භාවය:** ස්වයංක්‍රීයකරණය හරහා ලබාගත හැකි නව සේවා (උදා: මාර්ගගත පොත් වෙන් කිරීම, ඩිජිටල් සම්පත්) පිළිබඳව පාඨකයන් දැනුවත් කිරීම සඳහා විවිධ මාධ්‍ය හරහා ප්‍රචාරක කටයුතු සිදු කළ යුතුය.

**6. නිරීක්ෂණය සහ පසුවිපරම් සිදු කිරීම**

- **කාර්ය සාධන දර්ශක** (Key Performance Indicators - KPIs): ස්වයංක්‍රීයකරණය කළ පුස්තකාලවල කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම සඳහා දත්ත ඇතුළත් කිරීමේ අනුපාත, පාඨක භාවිතය, සේවා කාර්යක්ෂමතාව වැනි කාර්ය සාධන දර්ශක ස්ථාපිත කිරීම.

- **විමර්ශනය හා පසුවිපරම් සිදු කිරීම :** ස්වයංක්‍රීයකරණ පද්ධතිවල ක්‍රියාකාරීත්වය, ගැටලු සහ පාඨක තෘප්තිය මැන බැලීම සඳහා නිත්‍ය වාර්තා සහ පසුවිපරම් සිදු කිරීම.

මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන්, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුතුවල අඛණ්ඩතාවය සහ සාර්ථකත්වය සහතික කොට,මෙරට ජනතාවට 21 වන සියවසට ගැලපෙන, කාර්යක්ෂම සහ පහසු ප්‍රවේශයකින් යුත් තොරතුරු සේවාවක් ලබා දීමට හැකි වනු ඇත.

## 5.3 නිගමනය

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය කිරීම පිළිබඳ 2025 වර්ෂයේදී සිදුකළ මෙම සමීක්ෂණය මඟින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළව වර්තමාන තත්ත්වය, ලබා ඇති සාර්ථකත්වය, මුහුණදී ඇති අභියෝග සහ ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳව සම්පූර්ණ දෘෂ්ටිකෝණයක් ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාලවල ක්‍රියාත්මක කරන ලද ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පිළිබඳ මෙම සමීක්ෂණය මඟින් අවබෝධකර ගත හැකි අතර සමීක්ෂණය මඟින් අනාවරණය වන පරිදි පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳව පළාත් පාලන ආයතන මඟින් ගෙන ඇති පියවර සංවිධානාත්මක වුවද තාක්ෂණික පහසුකම්, මූල්‍යමය ප්‍රතිපාදන සහ පුහුණු කාර්යය මණ්ඩලය වැනි සාධක සම්බන්ධයෙන් පවතින අභියෝග හේතුවෙන්, මෙම කාර්යයන්වල සම්පූර්ණ සාර්ථකත්වයක් ලබා ගත නොහැකිවී තිබේ.

මෙම සමීක්ෂණයෙන් හෙළිවන පරිදි ICTA, UNDP, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් පාලන ආයතන සහ විවෘත විශ්වවිද්‍යාලය වැනි ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති ඔස්සේ දිවයින පුරා මහජන පුස්තකාල 156 ක් ස්වයංක්‍රීයකරණය/පරිගණකගත කිරීමට ලක්ව ඇත. මෙය ජාතික මට්ටමින් පුස්තකාල සේවා වැඩි දියුණු කිරීමේ සාර්ථක පියවරක් ලෙස සැලකිය හැකිය. මෙම ව්‍යාපෘති මඟින් එම පුස්තකාලවලට පරිගණක, සර්වර්, බාර්කෝඩ් රීඩර්ස් සහ අන්තර්ජාල පහසුකම් වැනි අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සහ උපකරණ සපයා දී ඇත. KOHA වැනි විවෘත මූලාශ්‍ර මෘදුකාංග බහුලව භාවිත වීම හේතුවෙන් පුස්තකාල කාර්යයන්වල කාර්යක්ෂමතාව වැඩි කිරීමට හැකි වී ඇත. ස්වයංක්‍රීයකරණය හේතුවෙන් පුස්තකාලවල අන්තර්ජාල පහසුකම්, Wi-Fi පහසුකම්, ඡායා පිටපත් සේවා, තොරතුරු ගවේෂණ හැකියාව සහ සාමාජික කළමනාකරණය වැනි සේවා සැලකිය යුතු ලෙස වැඩි දියුණු වී ඇති අතර, එමඟින් පාඨකයන්ට වඩාත් කාර්යක්ෂම සහ තෘප්තිකර සේවාවක් ලබා දීමට හැකි වී ඇත.

කෙසේ වෙතත්, ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය තුළ සහ ඊට පසුකාලීනව මෙම පුස්තකාල අභියෝග රැසකට මුහුණ දී ඇති බව පැහැදිලි වේ. පුහුණු කාර්ය මණ්ඩලය සේවාවෙන් ඉවත්ව යාම, සර්වර් සහ ජාලකරණ ගැටලු, නඩත්තු කටයුතුවල දුර්වලතා, මූල්‍ය ප්‍රතිපාදන අඩුවීම සහ අවශ්‍ය උපකරණ හිඟතාවය, දත්තවල ආරක්ෂාව සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම (Backups) වැනි ගැටලු බොහෝ පුස්තකාල සඳහා ස්වයංක්‍රීයකරණ සේවාවල අඛණ්ඩතාවයට සහ කාර්යක්ෂමතාවයට බාධා එල්ල කර ඇත.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සපයනු ලබන පුහුණු වැඩසටහන් සහ තාක්ෂණික සහාය ප්‍රමාණවත් නොවීමද තවත් ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත. දත්ත විශ්ලේෂණය මඟින් හෙළිවන පරිදි තවමත් ශ්‍රී ලංකාවේ බොහෝ මහජන පුස්තකාල සම්පූර්ණයෙන් ස්වයංක්‍රීයකරණය කර නොමැති අතර, ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාලවලද නව තාක්ෂණික පද්ධති භාවිතයට අදාළව සීමාවන් පවතී. එමෙන්ම, KOHA වැනි විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතය බහුල වුවද, එහි සියලුම මොඩියුල ක්‍රියාත්මක කිරීම සීමිත බවත් අනාවරණය වේ.

මෙම සමීක්ෂණයෙන් හඳුනා ගත් තවත් වැදගත් කරුණක් වන්නේ, පුස්තකාල පරිශීලකයින්ගේ තොරතුරු සාක්ෂරතාවය, තාක්ෂණික දැනුම සහ ප්‍රයෝජන ගැන ඇති අවබෝධය වැඩි කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතු බවය. එමෙන්ම, ස්වයංක්‍රීයකරණය සඳහා වූ පදනමක් සැලසීම සඳහා රාජ්‍යය මට්ටමින් ස්ථිර මූල්‍ය අනුග්‍රහයන්, පුහුණු වැඩසටහන්, සහ තාක්ෂණික උපකරණ සැපයීම අත්‍යාවශ්‍යවන බවද පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාලවල ස්වයංක්‍රීයකරණ කටයුතු සීමිත ප්‍රමාණයකට පමණක් ඉටු වී ඇති අතර, තාක්ෂණික පහසුකම්, මෘදුකාංග, මිනිස් සම්පත් සහ මූල්‍යමය සීමා මත පදනම්ව තවදුරටත් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය පවතින බව මෙම සමීක්ෂණය මඟින් අනාවරණය වේ.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ වැඩසටහන සාර්ථකව ආරම්භ වී ඇතත්, එහි අනාගත සුරක්ෂිතතාවය සඳහා සැලකිල්ලට ගත යුතු බාධක රැසක් ඇති බව අනාවරණය වේ. මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා ස්ථිර මූල්‍ය සම්පත්, අඛණ්ඩ පුහුණු වැඩසටහන්, ශක්තිමත් තාක්ෂණික බලගැන්වීම් සහ සියලුම පාර්ශවකරුවන් අතර සහයෝගීතාවය වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම පර්යේෂණය මඟින් ලබාගත් තොරතුරු සහ නිර්දේශ මඟින් රටේ මහජන පුස්තකාල පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අනාගත ප්‍රතිපත්ති සැලසුම්වලට මඟ පෙන්විය හැකිය. එබැවින්, මෙම සමීක්ෂණයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ සහ නිගමන සෙසු පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පුස්තකාල කළමනාකරුවන් සහ රාජ්‍ය අංශවලට අවශ්‍ය උපදෙස් හා ප්‍රායෝගික මඟ පෙන්වීමක් වන අතර, නව තාක්ෂණික යුගයට සරිලන පුස්තකාල පද්ධතියක් ගොඩනඟා ගැනීම සඳහා මූලික පදනමක් වශයෙන් ද භාවිතයට ගත හැකිය.

කෙසේ වෙතත්, තාක්ෂණික පුහුණුව, මෘදුකාංග නඩත්තුව, ජාලකරණය සහ දත්තවල ආරක්ෂාව යන අංශවල පවතින අභියෝග හඳුනා ගැනීමෙන් එම ගැටලු විසඳා ගැනීම සඳහා ව්‍යාපෘතිමය වශයෙන් සහ ප්‍රතිපත්තිමය මට්ටමින් අවධානය යොමු කළ යුතුය. මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබන නිගමන සහ යෝජනා, ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පද්ධතිය ස්වයංක්‍රීයකරණයට සහ තාක්ෂණිකව සවිබල ගැන්වීම සඳහා විශිෂ්ට මාර්ගෝපදේශයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Balasooriya, H. (n.d.). *Digital Libraries (DL) in Sri Lanka: An Overview*. https://www.academia.edu/5833775/Digital_Libraries_DL_in_Sri_Lanka_an_Overview

Basu, R. (2020). *10 best open source and free library management software*. *TechJockey*. https://www.techjockey.com/blog/best-open-source-free-library-management-software

Hindagolla, M. (2013). *Digital library development and its issues in Sri Lanka: Review of literature*. 57, 89–103. https://www.researchgate.net/publication/343628383_Digital_Library_Development_and_Its_Issues_in_Sri_Lanka_Review_of_Literature

International Federation of Library Associations and Institutions (IFLA). (2013). *IFLA/UNESCO digital library manifesto*. http://www.ifla.org/digital-libraries/manifesto

Malkanthi, D. (2017). *Status of university library automation in Sri Lanka: A survey*. *Journal of the University Librarians Association of Sri Lanka*, *20*(2), 70–80. https://doi.org/10.4038/jula.v20i2.7902

Marasinghe, I. (2022). *Open source initiatives in public libraries in Sri Lanka: Study of expert's perception*. *Journal of the University Librarians Association of Sri Lanka*, *25*(2), 71–90. https://doi.org/10.4038/jula.v25i2.8059

Rao, I. K. R. (1992). *Library automation*. New Age International, New Delhi.

Ravikumar, M. N., & Ramanan, T. (2015). *Automating of public libraries in Batticaloa district using KOHA Open-source Software : Recording an experience.* Conference: International Conference on What's next in Libraries? Trends, Space, and Partnerships.

Wijayaratne, A. (2005). *Automation of library functions with special reference to circulation system adopted at the library of the Open University of Sri Lanka*. *Journal of the University Librarians Association of Sri Lanka*, *9*, 12–22.

ඇමුණුම 01: අධ්‍යයනයට ලක් කරන ලද ස්වයංක්‍රීයකරණය කළ පුස්තකාල ලැයිස්තුව

| අනු අංකය | පළාත් පාලන ආයතන වර්ගය | පළාත් පාලන ආයතනයෙහි නම | පුස්තකාලයෙහි නම |
|---|---|---|---|
| 1 | මහ නගර සභාව | කොළඹ මහ නගර සභාව | කොළඹ මහජන පුස්තකාලය |
| 2 | මහ නගර සභාව | බදුල්ල මහ නගර සභාව | සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය |
| 3 | මහ නගර සභාව | මඩකලපුව මහ නගර සභාව | මඩකලපුව මහජන පුස්තකාලය |
| 4 | මහ නගර සභාව | කුරුණෑගල මහ නගර සභාව | කුරුණෑගල මහජන පුස්තකාලය |
| 5 | මහ නගර සභාව | පොළොන්නරුව මහ නගර සභාව | බුද්ධිමණ්ඩප පුස්තකාලය |
| 6 | මහ නගර සභාව | හම්බන්තොට මහ නගර සභාව | හම්බන්තොට මහජන පුස්තකාලය |
| 7 | මහ නගර සභාව | කඩුවෙල මහ නගර සභාව | අතුරුගිරිය මහජන පුස්තකාලය |
| 8 | මහ නගර සභාව | කොළඹ මහ නගර සභාව | බෙල්මන්ට් මහජන පුස්තකාලය |
| 9 | මහ නගර සභාව | බණ්ඩාරවෙල මහ නගර සභාව | බණ්ඩාරවෙල  මහජන පුස්තකාලය |
| 10 | මහ නගර සභාව | හලාවත මහ නගර සභාව | හලාවත මහජන පුස්තකාලය |
| 11 | මහ නගර සභාව | මොරටුව  මහ නගර සභාව | මොරටුව මහජන පුස්තකාලය |
| 12 | මහ නගර සභාව | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | නුගේගොඩ මහජන පුස්තකාලය |
| 13 | මහ නගර සභාව | කොළඹ මහ නගර සභාව | කොටහේන ශාඛා පුස්තකාලය |
| 14 | මහ නගර සභාව | කෑගල්ල මහ නගර සභාව | කෑගල්ල මහ නගර සභා මහජන පුස්තකාලය |
| 15 | මහ නගර සභාව | ගාල්ල මහ නගර සභාව | ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය |
| 16 | මහ නගර සභාව | පොළොන්නරුව මහ නගර සභාව | පොළොන්නරුව බුද්ධිමණ්ඩප මහජන පුස්තකාලය |
| 17 | මහ නගර සභාව | අනුරාධපුර මහ නගර සභාව | අනුරාධපුර මහජන පුස්තකාලය |
| 18 | මහ නගර සභාව | නුවරඑළිය මහ නගර සභාව | නුවරඑළිය මහජන පුස්තකාලය |
| 19 | මහ නගර සභාව | බදුල්ල මහ නගර සභාව | සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය |
| 20 | මහ නගර සභාව | කල්මුණේ  මහ නගර සභාව | කල්මුණේ මහජන පුස්තකාලය |

| | | | |
|---|---|---|---|
| 21 | මහ නගර සභාව | මීගමුව මහ නගර සභාව | මීගමුව මහජන පුස්තකාලය |
| 22 | මහ නගර සභාව | ගම්පහ මහ නගර සභාව | ගම්පහ මහජන පුස්තකාලය |
| 23 | මහ නගර සභාව | කොළඹ මහ නගර සභාව | කිරුළපන ශාඛා පුස්තකාලය |
| 24 | මහානගර සභාව | යාපනය  මහ නගර සභාව | යාපනය මහජන පුස්තකාලය |
| 25 | මහ නගර සභාව | මාතර මහ නගර සභාව | කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලය |
| 26 | මහ නගර සභාව | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | මධ්‍ය පුස්තකාලය, රාජගිරිය |
| 27 | මහානගර සභාව | ශ්‍රි ජයවර්ධපුර කෝට්ටේ මහ නගර සභාව | මහජන පුස්තකාලය, බැද්දගාන |
| 28 | මහානගර සභාව | ශ්‍රී ජයවරධපුර කෝට්ටේ මහ නගර සභාව | උඩහමුල්ල මහජන පුස්තකාලය |
| 29 | මහ නගර සභාව | හොරණ මහ නගර සභාව | හොරණ මහජන පුස්තකාලය |
| 30 | මහ නගර සභාව | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | මධ්‍ය පුස්තකාලය |
| 31 | නගර සභාව | තංගල්ල නගර සභාව | තංගල්ල මහජන පුස්තකාලය |
| 32 | නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ මහජන පුස්තකාලය |
| 33 | නගර සභාව | අම්පාර නගර සභාව | අම්පාර මහජන පුස්තකාලය |
| 34 | නගර සභාව | මන්නාරම නගර සභාව | මන්නාරම මහජන පුස්තකාලය |
| 35 | නගර සභාව | පේදුරුතුඩුව නගර සභාව | පේදුරුතුඩුව මහජන පුස්තකාලය |
| 36 | නගර සභාව | ත්‍රිකුණාමලය නගර සභාව | ත්‍රිකුණාමලය මහජන පුස්තකාලය |
| 37 | නගර සභාව | කින්නියා නගර සභාව | කින්නියා මහජන පුස්තකාලය |
| 38 | නගර සභාව | එරාවූර් නගර සභාව | එරාවූර් මහජන පුස්තකාලය |
| 39 | නගර සභාව | චාවකච්චේරි නගර සභාව | චාවකච්චේරි මහජන පුස්තකාලය |
| 40 | නගර සභාව | මහරගම නගර  සභාව | මහරගම  මහජන පුස්තකාලය |
| 41 | නගර සභාව | පානදුර නගර සභාව | පානදුර මහජන පුස්තකාලය |
| 42 | නගර සභාව | පුත්තලම  නගර සභාව | පුත්තලම මහජන පුස්තකාලය |
| 43 | නගර සභාව | වැලිගම නගර සභාව | වැලිගම මහජන පුස්තකාලය |

| | | | |
|---|---|---|---|
| 44 | නගර සභාව | ගම්පොළ නගර සභාව | ගම්පොළ මහජන පුස්තකාලය |
| 45 | නගර සභාව | නාවලපිටිය නගර සභාව | නාවලපිටිය නගර සභා මහජන පුස්තකාලය |
| 46 | නගර සභාව | මිනුවන්ගොඩ නගර සභාව | සිරිවර්ධන මහජන පුස්තකාලය |
| 47 | නගර සභාව | කාත්තන්කුඩි නගර සභාව | කාත්තන්කුඩි මහජන පුස්තකාලය |
| 48 | නගර සභාව | කැස්බෑව නගර සභාව | පිළියන්දල මහජන පුස්තකාලය |
| 49 | නගර සභාව | වත්තල මාබෝල නගර සභාව | වත්තල මාබෝල මහජන පුස්තකාලය |
| 50 | නගර සභාව | කටුනායක සීදූව නගර සභාව | ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අනුස්මරණ මහජන පුස්තකාලය |
| 51 | නගර සභාව | වව්නියා නගර සභාව | වව්නියා මහජන පුස්තකාලය |
| 52 | නගර සභාව | කැස්බෑව නගර සභාව | කැස්බෑව මහජන පුස්තකාලය |
| 53 | නගර සභාව | කුලියාපිටිය නගර සභාව | අයි.එම්.ආර්.ඒ.ඊරියගොල්ල සියවස මහජන පුස්තකාලය |
| 54 | නගර සභාව | හොරණ නගර සභාව | ජී.ඩී.එල්.ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලය |
| 55 | නගර සභාව | හොරණ නගර සභාව | අතිපූජ්‍ය රැටියල පඤ්ඤාසාර නාහිමි අනුස්මරණ මහජන පුස්තකාලය |
| 56 | නගර සභාව | හැටන් දික්ඔය නගර සභාව | හැටන් දික්ඔය නගර සභා මහජන පුස්තකාලය |
| 57 | නගර සභාව | ඇඹිලිපිටිය නගර සභාව | ඇඹිලිපිටිය නගර සභා මහජන පුස්තකාලය |
| 58 | නගර සභාව | බලන්ගොඩ නගර සභාව | බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය |
| 59 | නගර සභාව | බේරුවල නගර සභාව | බේරුවල මහජන පුස්තකාලය |
| 60 | නගර සභාව | වත්තේගම නගර සභාව | වත්තේගම මහජන පුස්තකාලය |
| 61 | ප්‍රාදේශීය සභාව | වැලිගමුව ප්‍රාදේශීය සභාව | මධ්‍යම මහජන පුස්තකාලය - හෙට්ටිපොළ |
| 62 | ප්‍රාදේශීය සභාව | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | මහගම මහජන පුස්තකාලය |
| 63 | ප්‍රාදේශීය සභාව | ජා -ඇල ප්‍රාදේශීය සභාව | කඳාන මහජන පුස්තකාලය |
| 64 | ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව | දොළුව මහජන පුස්තකාලය |
| 65 | ප්‍රාදේශීය සභාව | වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව | කිරිමැටියාන මහජන පුස්තකාලය |
| 66 | ප්‍රාදේශීය සභාව | නල්ලූර් ප්‍රාදේශීය සභාව | නල්ලූර් මහජන පුස්තකාලය |

| | | | |
|---|---|---|---|
| 67 | ප්‍රාදේශීය සභාව | වැලිගෙපොල පදේශයේ සභාව | ඕපනායක මහජන පුස්තකාලය |
| 68 | ප්‍රාදේශීය සභාව | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | වේයන්ගොඩ මහජන පුස්තකාලය |
| 69 | ප්‍රාදේශීය සභාව | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව | රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලය |
| 70 | ප්‍රාදේශීය සභාව | හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව | දියතිලක මහජන පුස්තකාලය |
| 71 | ප්‍රාදේශීය සභාව | ගලේවෙල ප්‍රාදේශීය සභාව | ගලේවෙල මහජන පුස්තකාලය |
| 72 | ප්‍රාදේශීය සභාව | නොච්චියාගම ප්‍රාදේශීය සභාව | ඩිජිටල් සහ ස්වයංක්‍රීය දිස්ත්‍රික් ආදර්ශ මහජන පුස්තකාලය |
| 73 | ප්‍රාදේශීය සභාව | හක්මන ප්‍රාදේශීය සභාව | හක්මන මහජන පුස්තකාලය |
| 74 | ප්‍රාදේශීය සභාව | බිබිල ප්‍රාදේශීය සභාව | බිබිල මහජන පුස්තකාලය |
| 75 | ප්‍රාදේශීය සභාව | වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව | වෙන්ගලචෙඩ්ඩිකුලම් පුස්තකාලය |
| 76 | ප්‍රාදේශීය සභාව | ත්‍රිකුණාමලය නගරය සහ ග්‍රේවට්ස් ප්‍රාදේශීය සභාව | උප්පුවේලි මහජන පුස්තකාලය |
| 77 | ප්‍රාදේශීය සභාව | පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව | පුදුකුඩිඉරිප්පු මහජන පුස්තකාලය |
| 78 | ප්‍රාදේශීය සභාව | කරච්චි ප්‍රාදේශීය සභාව | වඩ්ඩක්කච්චි මහජන පුස්තකාලය |
| 79 | ප්‍රාදේශීය සභාව | ගල්නෑව ප්‍රාදේශීය සභාව | ගල්නෑව මහජන පුස්තකාලය |
| 80 | ප්‍රාදේශීය සභාව | කහටගස්දිගිලිය ප්‍රාදේශිය සභාව | කහටගස්දිගිලිය මහජන පුස්තකාලය |
| 81 | ප්‍රාදේශීය සභාව | මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව | මැදිරිගිරිය මහජන පුස්තකාලය |
| 82 | ප්‍රාදේශීය සභාව | කෝරලේපත්තු ප්‍රාදේශීය සභාව | ජේතාලෙයි මහජන පුස්තකාලය |
| 83 | ප්‍රාදේශීය සභාව | උහන ප්‍රාදේශීය සභාව | උහන මහජන පුස්තකාලය |
| 84 | ප්‍රාදේශීය සභාව | තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව | තම්බුලුවිල් මහජන පුස්තකාලය |
| 85 | ප්‍රාදේශීය සභාව | බුත්තල ප්‍රාදේශීය සභාව | බුත්තල මහජන පුස්තකාලය |
| 86 | ප්‍රාදේශීය සභාව | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව | සියඹලාණ්ඩුව මහජන පුස්තකාලය |
| 87 | ප්‍රාදේශීය සභාව | මහියංගණය ප්‍රාදේශීය සභාව | මහියංගණය මහජන පුස්තකාලය |
| 88 | ප්‍රාදේශීය සභාව | රිදිමාලියද්ද ප්‍රාදේශීය සභාව | රිදිමාලියද්ද මහජන පුස්තකාලය |
| 89 | ප්‍රාදේශීය සභාව | වව්නියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව | කූමන්කුලම් මහජන පුස්තකාලය |

| | | | |
|---|---|---|---|
| 90 | ප්‍රාදේශීය සභාව | වන්කානේ ප්‍රාදේශීය සභාව | වන්කානේ මහජන පුස්තකාලය |
| 91 | ප්‍රාදේශීය සභාව | පූනකරී ප්‍රාදේශීය සභාව | පූනකරී මහජන පුස්තකාලය |
| 92 | ප්‍රාදේශීය සභාව | මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව | මුලතිව් මහජන පුස්තකාලය |
| 93 | ප්‍රාදේශීය සභාව | කොටපොල ප්‍රාදේශීය සභාව | දෙනියාය මහජන පුස්තකාලය |
| 94 | ප්‍රාදේශීය සභාව | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව | හිඟුරක්ගොඩ මහජන පුස්තකාලය |
| 95 | ප්‍රාදේශීය සභාව | කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව | කිරින්ද පුහුල්වැල්ල මහජන පුස්තකාලය |
| 96 | ප්‍රාදේශීය සභාව | පදියතලාව ප්‍රාදේශීය සභාව | පදියතලාව මහජන පුස්තකාලය |
| 97 | ප්‍රාදේශීය සභාව | සීතාවක ප්‍රාදේශීය සභාව | පාදුක්ක බණ්ඩාරනායක නිදහස් මහජන පුස්තකාලය |
| 98 | ප්‍රාදේශීය සභාව | ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව | තැන්නේකුඹුර මහජන පුස්තකාලය |
| 99 | ප්‍රාදේශීය සභාව | සීතාවක ප්‍රාදේශීය සභාව | පිලිප් ගුණවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලය - හංවැල්ල |
| 100 | ප්‍රාදේශීය සභාව | මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව | එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජන්ම ශත සංවත්සර මහජන පුස්තකාලය |
| 101 | ප්‍රාදේශීය සභාව | මාවතගම ප්‍රාදේශීය සභාව | ජී.එම්.ප්‍රේමචන්ද්‍ර ගුණානුස්මරණ මාවතගම මහජන පුස්තකාලය |
| 102 | ප්‍රාදේශීය සභාව | බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව | බෙලිඅත්ත මහජන පුස්තකාලය |
| 103 | ප්‍රාදේශීය සභාව | කැකිරාව ප්‍රාදේශීය සභාව | ජී.ඩී.ඩේවිඩ් අප්පුහාමි ගුණානුස්මරණ මහජන පුස්තකාලය, කැකිරාව |
| 104 | ප්‍රාදේශීය සභාව | වැල්ලවාය ප්‍රාදේශීය සභාව | වැල්ලවාය මහජන පුස්තකාලය |
| 105 | ප්‍රාදේශීය සභාව | දොම්පෙ ප්‍රාදේශීය සභාව | කිරිදිවැල මහජන පුස්තකාලය |
| 106 | ප්‍රාදේශීය සභාව | අගලවත්ත ප්‍රාදේශීය සභාව | ශ්‍රී ධර්මපාල මහජන පුස්තකාලය |
| 107 | ප්‍රාදේශීය සභාව | හොරණ ප්‍රාදේශීය සභාව | ඉංගිරිය මහජන පුස්තකාලය |
| 108 | ප්‍රාදේශීය සභාව | කටාන ප්‍රාදේශීය සභාව | රද්දොලුගම මහජන පුස්තකාලය |
| 109 | ප්‍රාදේශීය සභාව | හෝමාගම ප්‍රාදේශීය සභාව | බණ්ඩාරනායක මහජන පුස්තකාලය |
| 110 | ප්‍රාදේශීය සභාව | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | නිට්ටඹුව මහජන පුස්තකාලය |
| 111 | ප්‍රාදේශීය සභාව | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව | සකලසූරිය මහජන පුස්තකාලය, දූනගහ |

| | | | |
|---|---|---|---|
| 112 | ප්‍රාදේශීය සභාව | මීරිගම ප්‍රාදේශීය සභාව | අතිපූජ්‍ය වේවැල්දෙණියේ ශ්‍රී මේධාලංකාර මහා නාහිමි ගුණානුස්මරණ මහජන පුස්තකාලය |
| 113 | ප්‍රාදේශීය සභාව | වත්තල ප්‍රාදේශීය සභාව | හැඳල මහජන පුස්තකාලය |
| 114 | ප්‍රාදේශීය සභාව | වත්තල ප්‍රදේශීය සභාව | වැලිසර මහජන පුස්තකාලය |
| 115 | ප්‍රාදේශීය සභාව | කටාන  ප්‍රාදේශීය සභාව | ආඩිඅම්බලම මහජන පුස්තකාලය |
| 116 | ප්‍රාදේශීය සභාව | මතුගම ප්‍රාදේශීය සභාව | සී ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර මහජන පුස්තකාලය |
| 117 | ප්‍රාදේශීය සභාව | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | බුලත්සිංහල මහජන පුස්තකාලය |
| 118 | ප්‍රාදේශීය සභාව | හෝමාගම ප්‍රාදේශීය සභාව | මත්තේගොඩ මහජන පුස්තකාලය |
| 119 | ප්‍රාදේශීය සභාව | හෝමාගම ප්‍රාදේශීය සභාව | වැතර සිරිලියනගේ මහජන පුස්තකාලය |
| 120 | ප්‍රාදේශීය සභාව | හෝමාගම ප්‍රාදේශීය සභාව | පිලිප් ගුණවර්ධන මහජන පුස්තකාලය |
| 121 | ප්‍රාදේශීය සභාව | හෝමාගම ප්‍රාදේශීය සභාව | සුගතන් එදිරිසිංහ මහජන පුස්තකාලය |
| 122 | ප්‍රාදේශීය සභාව | කටාන ප්‍රාදේශීය සභාව | දෙමන්හන්දිය මහජන පුස්තකාලය |
| 123 | ප්‍රාදේශීය සභාව | සීතාවක  ප්‍රාදේශීය  සභාව | කහහේන  පිලිප්  ගුණවර්ධන අනුස්මරණ  මහජන පුස්තකාලය |
| 124 | ප්‍රාදේශීය සභාව | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව | හල්දුම්මුල්ල මහජන පුස්තකාලය |
| 125 | ප්‍රාදේශීය සභාව | පානදුර ප්‍රාදේශීය සභාව | වාද්දුව මහජන පුස්තකාලය |
| 126 | ප්‍රාදේශීය සභාව | නල්ලූර් ප්‍රාදේශීය සභාව | කොකුවිල් මහජන පුස්තකාලය |
| 127 | ප්‍රාදේශීය සභාව | වාලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව | උඩුවිල් මහජන පුස්තකාලය |
| 128 | ප්‍රාදේශීය සභාව | වාලිකමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව | උරුම්පිරායි මහජන පුස්තකාලය |
| 129 | ප්‍රාදේශීය සභාව | වාලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව | චුන්නාක්කම් මහජන පුස්තකාලය |
| 130 | ප්‍රාදේශීය සභාව | වාලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව | මනිපායි පද්දිනි මහජන පුස්තකාලය |
| 131 | ප්‍රාදේශීය සභාව | දොම්පේ  ප්‍රාදේශීය සභාව | පූගොඩ මහජන පුස්තකාලය |
| 132 | ප්‍රාදේශීය සභාව | බද්දේගම ප්‍රාදේශීය සභාව | බද්දේගම මහජන පුස්තකාලය |
| 133 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | උඩුපිල මහජන පුස්තකාලය |
| 134 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | නාරංවල මහජන පුස්තකාලය |

| | | | |
|---|---|---|---|
| 135 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | කන්දලියද්ද පාළුව මහජන පුස්තකාලය |
| 136 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | මල්වතුහිරිපිටිය මහජන පුස්තකාලය |
| 137 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | පහළ කරගහමුන මහජන පුස්තකාලය |
| 138 | ප්‍රාදේශීය සභාව | මහර ප්‍රාදේශීය සභාව | ඇටිකෙහෙල්ගල්ල මහජන පුස්තකාලය |
| 139 | ප්‍රාදේශීය සභාව | මුතූර් ප්‍රාදේශීය සභාව | මුතූර් මහජන පුස්තකාලය |
| 140 | ප්‍රාදේශීය සභාව | නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව | දුන්කන්නාව විද්‍යුත් පුස්තකාලය |
| 141 | ප්‍රාදේශීය සභාව | පන්නල ප්‍රාදේශීය සභාව | සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ මහජන පුස්තකාලය |
| 142 | ප්‍රාදේශීය සභාව | පන්නල ප්‍රාදේශීය සභාව | ඥාණප්‍රදීප මහජන පුස්තකාලය |
| 143 | ප්‍රාදේශීය සභාව | දැරණියගල ප්‍රාදේශීය සභාව | දැරණියගල මහජන පුස්තකාලය |
| 144 | ප්‍රාදේශීය සභාව | ආණමඩුව ප්‍රාදේශීය සභාව | ආණමඩුව මහජන පුස්තකාලය |
| 145 | ප්‍රාදේශීය සභාව | වලපනේ ප්‍රාදේශීය සභාව | ටී.බී.මු. හේරත් අනුස්මරණ මහජන පුස්තකාලය |
| 146 | ප්‍රාදේශීය සභාව | අකුරණ ප්‍රාදේශීය සභාව | අලවතුගොඩ මහජන පුස්තකාලය |
| 147 | ප්‍රාදේශීය සභාව | අකුරණ ප්‍රාදේශීය සභාව | අකුරණ මහජන පුස්තකාලය |
| 148 | ප්‍රාදේශීය සභාව | අකුරණ ප්‍රාදේශීය සභාව | ඇල්ලේකඩේ මහජන පුස්තකාලය |
| 149 | ප්‍රාදේශීය සභාව | අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව | මැටිහක්ක මහජන පුස්තකාලය |
| 150 | ප්‍රාදේශීය සභාව | පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව | රඹුක්පිටිය මහජන පුස්තකාලය |
| 151 | ප්‍රාදේශීය සභාව | ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව | කුමරතුඟු මහජන පුස්තකාලය |
| 152 | ප්‍රාදේශීය සභාව | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව | කඹුරුපිටිය මහජන පුස්තකාලය |
| 153 | ප්‍රාදේශීය සභාව | කොලොන්න ප්‍රාදේශීය සභාව | මහින්ද රාජපක්ෂ මහජන පුස්තකාලය |
| 154 | ප්‍රාදේශීය සභාව | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය |
| 155 | ප්‍රාදේශීය සභාව | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව | තෙලිජ්ජවිල මහජන පුස්තකාලය |
| 156 | ප්‍රාදේශීය සභාව | අයගම ප්‍රාදේශීය සභාව | අයගම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය |